# සිංහල භාෂාව හා සාහිත්‍යය

# 7 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය

(2016 සිට ක්‍රියාත්මක වේ.)



සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.
www.nie.lk

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## ගුරු මාර්ගෝපදේශය

## 7 ශ්‍රේණිය

(2016 සිට ක්‍රියාත්මක වේ.)

**සිංහල භාෂා දෙපාර්තමේන්තුව**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව.**

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

7 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය : 2016

© ජාතික අධ්‍යාපන ආයතනය

සිංහල භාෂා දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපෑල : info@nie.lk

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත් වන සහ එකොළොස් වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබී ය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම්වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කර ගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනාදි අංශ සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශය ලබා දීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශය උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නො වේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවකට හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස් වීමෙන් වැඩ ලෝකයට අවශ්‍ය වන නිපුණතා හා කුසලතාවලින් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය.

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් මගින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ හා සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුමය ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ මගින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක්වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම් සාධනය වීම සඳහා අන්තර්ගතය මගින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් පෙළ පොත හා ගුරු මාර්ගෝපදේශ යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය.

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය :** ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**සම්බන්ධීකරණය :** පී. ඒ. ඩී. රුවනි සිසිජා,
සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**භාෂා සංස්කරණය** තිස්ස ජයවර්ධන,
විශ්‍රාමික මහාචාර්ය,
කොළඹ විශ්වවිද්‍යාලය,
කොළඹ.

**අභ්‍යන්තර ලේඛක මණ්ඩලය :** ඩී.ඩබ්. දිසානායක,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර,
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

එම්. ජී. මුණසිංහ,
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

තිලිනි රත්නායක,
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න,
සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

පී. ඒ. ඩී. රුවනි සිසිජා,
සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

| | |
|---|---|
| **බාහිර ලේඛක මණ්ඩලය :** | එස්. ඕ. ප්‍රනාන්දු,<br>විශ්‍රාමික අධ්‍යක්ෂ,<br>සිංහල භාෂා දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය,<br>මහරගම.<br><br>එච්. පී. සුසිල් සිරිසේන,<br>කථිකාචාර්ය,<br>හාපිටිගම් අධ්‍යාපන විද්‍යාපීඨය,<br>මීරිගම.<br><br>ඩබ්. කරුණාරත්න,<br>කථිකාචාර්ය,<br>ගුරු මධ්‍යස්ථාන කළමනාකරු,<br>ගුරු මධ්‍යස්ථානය,<br>ගිරාගම,<br>පිළිමතලාව.<br><br>එස්. ලලිතා පද්මිණී,<br>නියෝජ්‍ය විදුහල්පති,<br>හලා/වෙන්/කටුකෙන්ද ශ්‍රී සංඝබෝධි ම.ම.වි.,<br>දංකොටුව.<br><br>ඩබ්. එම්. නිශ්ශංක බණ්ඩාර,<br>ගුරු සේවය,<br>බප/ගම්/දොම්පෙ ම. වි.,<br>දොම්පෙ.<br><br>එම්. ඒ. සුබසිංහ,<br>ගුරු සේවය,<br>බප/කැල/කරුණාරත්න බෞද්ධ ම.වි.,<br>කැලණිය. |
| **විෂය නිර්දේශ සම්පාදනය:** | මහාචාර්ය රත්නසිරි අරංගල,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,<br>නුගේගොඩ.<br><br>මහාචාර්ය ජයන්ත අමරසිංහ,<br>රුහුණු විශ්වවිද්‍යාලය,<br>මාතර.<br><br>පූජ්‍ය කුකුරම්පොළ ඤාණවිමල හිමි, කථිකාචාර්ය,<br>සිංහල භාෂා දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය,<br>මහරගම. |

එම්. ජී. මුණසිංහ, කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

තිලිනි රත්නායක, කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න, සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

පී. ඒ. ඩී. රුවනි සිසිජා, සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

එස්. ඕ. ප්‍රනාන්දු, විශ්‍රාමික අධ්‍යක්ෂ,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

එච්. එල්. ශ්‍රියානි අබේවික්‍රම,
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ,
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශය,
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය,
බත්තරමුල්ල.

එච්. පී. සුසිල් සිරිසේන, කථිකාචාර්ය,
හාපිටිගම ජාතික අධ්‍යාපන
විද්‍යාපීඨය,
මීරිගම.

ගයා වැයිහේන, ගුරු උපදේශක,
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය,
පාදුක්ක.

සුනිල් බියන්විල, ගුරුසේවය,
ගිරි/වික්‍රමශිලා ජාතික පාසල,
ගිරිඋල්ල.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක ව ඉටු කර ගැනීම සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත. මෙහි ඉගැන්වීම් ක්‍රියාකාරකම්වලට අනුකූල ව පාඩම් සැලසුම් සකස් කර ගැනීමට කටයුතු කිරීම ඵලදායී වේ යැයි අපේක්ෂා කෙරේ.

දැනට පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වනුයේ නිපුණතා පාදක විෂයමාලාවකි. මෙහි ඇතුළත් සියලු පාඩම් සැලසුම් ඉදිරිපත් කර ඇත්තේ ඊට අනුරූප වන පරිදි ය. නිපුණතාව, නිපුණතා මට්ටම හා විෂය අන්තර්ගතයට අදාළ කාලච්ඡේද සංඛ්‍යාව හා ඉගෙනුම් පල ද ඒ අනුව ඇතුළත් කර තිබේ. පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් ද, භාවිත කළ හැකි ගුණාත්මක යෙදවුම් ද, ඇගයීම හා තක්සේරුකරණය සඳහා වන උපදෙස් ද ඉදිරිපත් කර ඇත්තේ නිපුණතා සංවර්ධනය සඳහා ඉවහල් වන පරිද්දෙනි. ශ්‍රේණියට අදාළ විෂය අන්තර්ගතය ඒ ඒ වාරවලට අනුව බෙදා දක්වන ලද සටහනක් ද මේ සමග ඉදිරිපත් කර ඇත්තේ ගුරු භවතාගේ පහසුව පිණිස ය.

මාර්ගෝපදේශයෙහි උපදෙස් අනුව එදිනෙදා ඉගැන්වීම් කාර්යය සඳහා උචිත පාඩම් සැලසුම් ගුරුභවතාගේ අභිමතය පරිදි සකස් කර ගත යුතු ය. මෙහි දී ශිෂ්‍යයන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය වන පරිදි හා නිපුණතා සාක්ෂාත් වන පරිදි නිර්මාණශීලී ඉගෙනුම් අවස්ථා සම්පාදනය කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් අර්ථ සම්පන්න බවට පත් කිරීම ඔබගේ යුතුකම වන්නේ ය. ගුණාත්මක යෙදවුම් යටතේ ගුරුවරයාගේ පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇති පොතපත ඉවහල් කරගෙන ශිෂ්‍ය ඉගෙනුම් අත්දැකීම් තව දුරටත් පුළුල් කිරීම සඳහා කටයුතු කිරීම ද වැදගත් වනු ඇත. ඔබට විවිධ ගුරු භූමිකා හෝ විවිධ ක්‍රමවේද හෝ භාවිත කළ හැකි ය. එහෙත් අර්ථසම්පන්න ඉගෙනුම් පරිසරයක් පන්ති කාමරය තුළ නිර්මාණය කිරීම ඔබගේ කාර්යයයි.

ඔබ හඳුනාගත් ශිෂ්‍යයන්ගේ නිර්මාණශීලී කුසලතා වර්ධනය සඳහා කටයුතු කිරීමේ දී මෙහි සඳහන් පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් යටතේ නිර්දේශ කර ඇති දේශන, වාද විවාද, සාකච්ඡා ආදිය ද අවස්ථානුකූල ව යොදා ගත හැකි ය. ඉගෙනුම් ක්‍රියාවලිය තාක්ෂණය හා බද්ධ කර ගැනීම කාලෝචිත වනු ඇත. එනිසා හැකි සෑම අවස්ථාවක දී ම එවැනි තාක්ෂණික ඉගෙනුම් ආධාරක හෝ මෙවලම් හෝ භවිත කිරීම මගින් ඔබගේ ඉගැන්වීම් කාර්යයෙහි ගුණාත්මක බව වර්ධනය කර ගත හැකි ය. සෑම පාඩම් සැලසුමක් අවසානයේ දී ම ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය උපදෙස් ඉදිරිපත් කර ඇත. එම නිර්ණායක මැනෙන පරිදි සුදුසු ඇගයීම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමෙන් ඉගෙනුම් කාර්යය සඵල වනවා මෙන් ම ශිෂ්‍ය සාධන මට්ටම් ද ඉහළ යනු ඇත. භාෂා විෂයයේ වැදගත් ක්ෂේත්‍ර වන ශ්‍රවණ හා කථන කුසලතා මැනෙන පරිදි වාචික පරීක්ෂණ සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම ද භාෂා අධ්‍යයනය වඩාත් ඵලදායී වීමට හේතු වනු ඇත.

මෙම මාර්ගෝපදේශයෙහි අන්තර්ගත උපදෙස් ක්‍රියාත්මක කිරීමේ දී ශිෂ්‍යයන්ට උචිත පරිදි නිර්මාණශීලී ඉගැන්වීම් ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා ඔබට අවකාශ සලසා ඇති අතර, ඒ අනුව කටයුතු කිරීමෙන් ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය සාර්ථක කර ගැනීමට හැකි වේවා යනු අපගේ ප්‍රාර්ථනයයි.

ලේඛක මණ්ඩලය

| වාරය | පෙළ පොතේ පාඩම් අංකය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| 1 | 1 | 1 | 1.3 | ගොවි බිරියගේ නුවණ | 3 |
| | | 2 | 5.2 | ප්‍රස්තාව පිරුළු හා ඉඟි වැකි | 4 |
| | 2 | 3 | 1.1 | සරණංකර සඟරජ තෙරණුවෝ | 4 |
| | | 4 | 5.1 | සමානාර්ථ පද | 2 |
| | 3 | 5 | 3.1 | අක්ෂර මාලාව | 4 |
| | | 6 | 3.2 | අක්ෂර වින්‍යාසය | 4 |
| | 4 | 7 | 5.3 | ඔයිරයිරේ ඔයි රාමා | 3 |
| | | 8 | 6.1 | නාම පද (වචන භේදය හා පුරුෂ භේදය) | 6 |
| | 5 | 9 | 9.4 | ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනතාව | 3 |
| | | 10 | 6.1 | නාම පද (උක්ත - අනුක්ත භේදය) | 3 |
| | 6 | 11 | 11.1 | මේ කාගේ දෝ කමතා | 3 |
| | | 12 | 5.1 | විරුද්ධාර්ථ පද | 2 |
| | 7 | 13 | 9.5 | එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා | 3 |
| | | 14 | 6.2 | ක්‍රියා පද (පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා) | 3 |
| | 8 | 15 | 1.2 | කතාබහට සංයමයක් | 3 |
| 2 | 9 | 16 | 2.2 | තිලමුට්ඨි ජාතකය | 5 |
| | 10 | 17 | 10.2 | අපේ ලෝහ තාක්ෂණයේ යටගියාව | 4 |
| | | 18 | 6.3 | වාක්‍ය රීති | 3 |
| | 11 | 19 | 7.1 | රාජකාරී ලිපි | 4 |
| | | 20 | 7.2 | ආරාධනා පත්‍ර | 5 |
| | 12 | 21 | 11.2 | සිනා කුමරි | 4 |
| | | 22 | 12.1 | රස කවි ගොතමු, කවි රස විඳිමු | 4 |
| | 13 | 23 | 8.1 | වාක්‍ය රචනය | 4 |
| | 14 | 24 | 1.5 | අපි නිවේදන කියවමු / මාතෘකානුකූල කතා | 4 |
| | 15 | 25 | 8.2 | ලොවට තර්ජනයක් වන විද්‍යුත් අපද්‍රව්‍ය | 5 |
| | | 26 | 4.2 | පද බෙදීම | 2 |
| | 16 | 27 | 9.1 | සකි සඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර | 4 |
| | | 28 | 5.1 | තනි පද | 2 |
| 3 | 17 | 29 | 9.2 | සුදන ගුණ | 8 |
| | 18 | 30 | 9.3 | මා දුටු මුල් හිරු පෙන්වූ ලංකා | 5 |
| | 19 | 31 | 1.4 | දුං දුමටයි අඟුරු මටයි | 4 |
| | | 32 | 5.1 | විශේෂණ පද | 3 |
| | 20 | 33 | 2.1 | සකස් කට නොකී කට | 4 |
| | | 34 | 4.1 | විරාම ලකුණු | 4 |
| | 21 | 35 | 2.3 | පුස්තකාලයට පිය නගමු | 4 |
| | 22 | 36 | 12.3 | තොප්පි වෙළෙන්දා (දෙබස් රචනය) | 8 |
| | 23 | 37 | 10.1 | යහළුවෝ (ඊ. ඩබ්. අදිකාරම්තුමා) | 5 |
| | 24 | 38 | 12.2 | පොල් ළඳ සැටි (ප්‍රබන්ධ රචනය) | 5 |

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v - vii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | viii - ix |
| පටුන | x |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | xi - xxviii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | |
| ගොවි බිරියගේ නුවණ | 2-3 |
| ප්‍රස්තාව පිරුළු හා ඉඟි වැකි | 4-5 |
| සරණංකර සඟරජ තෙරණුවෝ | 6-8 |
| සමානාර්ථ පද | 9-10 |
| අක්ෂර මාලාව | 11- 12 |
| අක්ෂර වින්‍යාසය | 13-15 |
| ඔයිරයිරේ ඔයි රාමා (වී ගොවිතැන) | 16 |
| නාම පද (වචන භේදය හා පුරුෂ භේදය) | 17-18 |
| ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනතාව | 19-22 |
| නාම පද (උක්ත - අනුක්ත භේදය) | 23-24 |
| මේ කාගේ දෝ කමතා (ජනකවි) | 25 |
| විරුද්ධාර්ථ පද | 26-27 |
| එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා | 28 |
| ක්‍රියා පද (පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා) | 29-30 |
| කතාබහට සංයමයක් (සුහද සංවාද) | 32-33 |
| තිලමුට්ඨි ජාතකය | 34 |
| අපේ ලෝහ තාක්ෂණයේ යටගියාව | 35-36 |
| වාක්‍ය රීති | 37-39 |
| රාජකාරි ලිපි | 40-42 |
| ආරාධනා පත්‍ර | 43 |
| සිනා කුමරි (නූතන කවි) | 44-46 |
| රස කවි ගොතමු, කවි රස විඳිමු (පද්‍ය නිර්මාණ) | 47 |
| වාක්‍ය රචනය | 48-49 |
| අපි නිවේදන කියවමු / මාතෘකානුකූල කතා | 50 |
| ලොවට තර්ජනයක් වන විද්‍යුත් අපද්‍රව්‍ය | 51 |
| පද බෙදීම | 52 |
| සකි සඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර | 53-54 |
| තනි පද | |

| | |
|---|---|
| සුදන ගුණ (ලෝකෝපකාරය හා තිරුක්කුරල්) | 55 |
| මා දුටු මුල් හිරු පෙන්වූ ලංකා (දේශාභිමානී ගීතය) | 56 |
| දුං දුමටයි අඟුරු මටයි (ගුවන්විදුලි වැඩසටහන) | 57 |
| විශේෂණ පද | 58-59 |
| සකස් කට නොකී කට (ශබ්ද නගා කියවීම) | 60-61 |
| විරාම ලක්ෂණ | 62-63 |
| පුස්තකාලයට පිය නගමු (නිශ්ශබ්ද කියවීම) | 64 |
| තොප්පි වෙළෙන්දා (දෙබස් රචනය) | 65 |
| යහළුවෝ (ඊ. ඩබ්. අදිකාරම්තුමා) | 66-67 |
| පොල් ලද සැටි (නිර්මාණාත්මක ප්‍රබන්ධ රචනය) | 68-70 |

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## විෂය නිර්දේශය

## 7 ශ්‍රේණිය

**(2016 සිට ක්‍රියාත්මක කෙරේ)**

**සිංහල භාෂා දෙපාර්තමේන්තුව**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව.**

# හැඳින්වීම

අනාගත ලෝකයේ අභියෝග ජයගැනීමට සමත් දරු පරපුරක් රටට දායාද කිරීමේ කාර්ය භාරයේ වැඩි වගකීම හිමිවන්නේ අධ්‍යාපනයට ය. ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන දැනුම උකහා ගැනීම සඳහා අවශ්‍ය භාෂා කුසලතා සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. සිංහල භාෂාව, ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන මාධ්‍ය භාෂාව වේ. සිංහල භාෂාව ඇතුළු ව අනෙකුත් විෂය හැදෑරීම සඳහා සිංහල භාෂාව පිළිබඳ නිවැරදි දැනුම අත්‍යවශ්‍ය ය. භාෂාවේ චතුර්විධ කුසලතා වර්ධනය කර ගැනීමෙන් විෂය සාධන මට්ටම ඉහළ තලයකට නංවාලිය හැකි ය. සියලු විෂයන්හි සාධන මට්ටම වර්ධනය සඳහා භාෂා දැනුම අවශ්‍ය හෙයින් සිංහල භාෂාව පිළිබඳ කුසලතා සංවර්ධනය කිරීම මවුබස සිංහල විෂයයේ වගකීමක් ලෙස හඳුනා ගෙන ඇත.

සිංහල භාෂාව සියවස් ගණනාවක් තිස්සේ විකාශනය වූ භාෂාවකි. ඒ නිසා ම එහි විවිධ වාක්‍ය රීති මෙන් ම භාෂා ව්‍යවහාර ද දක්නට ලැබේ. ඒවා අධ්‍යයනය කිරීමෙන් භාෂා මාමකත්වයෙන් යුතු ව කටයුතු කිරීමට යොමු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිංහල සාහිත්‍යය, සිංහල භාෂා විෂය සමග ඒකාබද්ධ වූ විෂය කොටසකි. දයාව, කරුණාව ආදි මානව ගුණධර්මවලින් හෙබි සුබනම්‍ය මනසකින් හා සමබර පෞරුෂයකින් යුතු සංවේදී දරු පරපුරක් බිහි කිරීම සඳහාත් සාහිත්‍ය සේවනය අත්‍යවශ්‍ය සාධකයකි.

නව විෂය නිර්දේශය සකස් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක විෂය නිර්දේශය පාදක කර ගෙන ඇත. ඒ අනුව නව විෂය නිර්දේශය ද නිපුණතා පාදක ව ඉදිරිපත් කෙරේ. මෙම විෂය නිර්දේශය සකස් කිරීමේ දී ආචාර්ය ජැනට් රෙනෝල්ඩ්ස් මහත්මියගේ සහ ආචාර්ය සෙනරත් නානායක්කාර මහතාගේ ශ්‍රී ලංකාවේ 6 - 9 ශ්‍රේණි සඳහා විෂය ප්‍රමිති රාමුව (Standards for grade 6 - 9 subjects in Sri Lankan Schools. Authors - Dr. Janet Reynolds and Dr. Senarath Nanayakkara) නමැති ලේඛනයේ ඇතැම් අංග උචිත පරිදි යොදා ගෙන ඇත.

## ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලිය තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනයෙන් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය මගින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප

## මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදී ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමය පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම,
යන හැකියා උපරි ම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාව මගින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 7 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි. | 1.1 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී ප්‍රතිචාර දක්වයි. | ● ඓතිහාසික කතාවකට සවන් දී ප්‍රතිචාර දැක්වීම.<br>- වැලිවිට සරණංකර හිමි (ශ්‍රවණ මාධ්‍යයට ගැළපෙන ලෙස සකස් කළ විස්තරයක්) | ● සවන් දීමේ වැදගත්කම හඳුනා ගෙන විස්තර කරයි.<br>● සවන් දී ග්‍රහණය කර ගත් කරුණු ඉදිරිපත් කරයි.<br>● ඵලදායී ශ්‍රවණය සඳහා අවධානයෙන් හා අවබෝධයෙන් සවන් දීම අත්‍යවශ්‍ය බව ප්‍රකාශ කරයි. | 04 |
| | 1.2 සවන් දී ප්‍රතිචාර දැක්වීමේ දී ආචාරශීලී බව හා සංයමය ප්‍රදර්ශනය කරයි. | ● පුද්ගලයන් අතර සිදු වන කතාබහ<br>- පාසල් පරිසරයේ පවිත්‍රතාව රැක ගැනීම සම්බන්ධ ව පාසලේ දී සිදු වන කතාබහක් | ● පුද්ගල විවිධත්වය අනුව භාෂාව භාවිත කරයි.<br>● පුද්ගල විවිධත්වය හා අවස්ථාව අනුව ප්‍රතිචාර දක්වයි.<br>● සංයමයෙන් යුතු ව සවන් දී ප්‍රතිචාර දක්වයි. | 04 |
| | 1.3 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රස විඳියි. | ● ජනකතාවක් | ● ජනකතාවට අවධානයෙන් යුතු ව සවන් දී ප්‍රතිචාර දක්වයි.<br>● ජන කතාවෙහි රසවත් සිද්ධි මතකයෙන් ඉදිරිපත් කරයි.<br>● ජන කතාවල ස්වභාවය හා පසුබිම විස්තර කරයි. | 04 |
| | 1.4 සාවධාන ව සවන් දී තොරතුරු රැස් කරයි. | ● ගුවන්විදුලි විචිත්‍රාංග වැඩසටහන්<br>- තුන්පත් රටා (ජේ. බී. දිසානායක) | ● සාවධාන ව සවන් දී වැදගත් තොරතුරු සටහන් කර ගනියි.<br>● සටහන් කරගත් තොරතුරු අවස්ථානුකූල ව ඉදිරිපත් කරයි.<br>● ගුවන්විදුලි වැඩසටහනක අන්තර්ගතය අගය කරයි.<br>● රැස් කර ගත් තොරතුරු අවස්ථෝචිත ව භාවිත කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.5 නිරවුල් ව හා නිවැරදි ලෙස බස හසුරුවමින් හඬ පාලනයෙන් යුතු ව කතා කරයි. | • නිවේදන<br>- පාසලේ එදිනෙදා සිදු කෙරෙන නිවේදන<br>• මාතෘකානුකූල කතා (ක්‍රියාකාරකම්) | • නිවැරදි ව බස හසුරුවමින් කතා කරයි.<br>• අන්‍යයන්ගේ අවධානය යොමු වන පරිදි හඬ පාලනයෙන් යුතු ව කතා කරයි.<br>• නිරවුල් ව හා පැහැදිලි ව තම අදහස් ප්‍රකාශ කරයි.<br>• සංයමයෙන් යුතු ව කතා කරයි.<br>• මාතෘකාවට අදාළ ව කතා කරයි. | 04 |
| 2.0<br>ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි. | 2.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි. | • පුවත් පත් වාර්තාවක්<br>• ශබ්දෝච්චාරණය වර්ධනය සඳහා ක්‍රියාකාරකම්<br>- සකස්කඩ<br>- ශ්ලෝක | • නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි.<br>• නිවැරදි හඬ පාලනයෙන් යුතු ව කියවයි.<br>• අවබෝධයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.<br>• විරාම ලකුණුවලට අවනත ව කියවයි.<br>• මනා වේගයක් පවත්වා ගනිමින් කියවයි. | 04 |
| | 2.2 විවිධ ශෛලියෙන් රචිත පොත පත කියවයි. | • තිලමුට්ඨී ජාතකය<br>- පන්සිය පනස් ජාතක පොත | • ශ්‍රාවකයන්ගේ අවධානය යොමු වන පරිදි කියවයි.<br>• ජාතක කතාවක ස්වභාවය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• තිලමුට්ඨී ජාතකයේ කතා සාරය ඉදිරිපත් කරයි.<br>• තිලමුට්ඨී ජාතකයෙන් ගත හැකි ජීවිතාදර්ශ ප්‍රකාශ කරයි. | 05 |

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 7 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ-කර ගත් කරුණු ඉදිරිපත් කරයි. | ● "පුස්තකාලයට පිය නගමු"<br>- පුස්තකාලය සහ එහි භාවිතය ඇසුරින් | ● අර්ථාවබෝධයෙන් යුතු ව පොත පත කියවයි.<br>● කියවා අවබෝධ කර ගත් කරුණු ඉදිරිපත් කරයි.<br>● කියවීමෙන් ලත් දැනුම අවස්ථෝචිත ව භාවිත කරයි. | 04 |
| 3.0<br>සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි. | 3.1 සිංහල අක්ෂරමාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි. | ● සිංහල අක්ෂරමාලාව නිවැරදි ව ලිවීම.<br>● අක්ෂර මාලාව වර්ග කිරීම.<br>- ස්වර<br>- ව්‍යඤ්ජන | ● අක්ෂරමාලාව හඳුනා ගෙන නිවැරදි ව අනුපිළිවෙළින් ඉදිරිපත් කරයි.<br>● අක්ෂරමාලාව ස්වර, ව්‍යංඤ්ජන වශයෙන් වර්ග කර දක්වයි.<br>● අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.<br>● ලේඛනයේ දී අක්ෂර නිවැරදි ව භාවිත කරයි. | 08 |
| | 3.2 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. | ● න , ණ , ල , ළ , ශ , ෂ , ස නිවැරදි ව භාවිතය.<br>● සඤ්ඤක අක්ෂර නිවැරදි ව වචනවල යෙදීම.<br>● අල්පප්‍රාණ, මහාප්‍රාණ නිවැරදි ව භාවිතය. | ● ලිවීමේ දී නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිතයේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>● න , ණ , ල , ළ , ශ , ෂ , ස අකුරු නිවැරදි ව යොදයි.<br>● සඤ්ඤක අක්ෂර නිවැරදි ව භාවිත කරයි.<br>● අල්පප්‍රාණ සහ ඊට අදාළ මහාප්‍රාණ අක්ෂර නිවැරදි ව භාවිත කරයි.<br>● ලිපි ලේඛනවල අක්ෂර වින්‍යාසය නිවැරදි කරයි. | 07 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0<br>ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි. | 4.1<br>විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලියයි. | • විරාම ලකුණු නිවැරදි ව භාවිත කිරීම.<br>- කෙටි ඉර, ඇල ඉර, දෙතිත.<br>(ක්‍රියාකාරකම්) | • විරාම ලකුණු නිවැරදි ව නම් කරයි.<br>• විරාම ලකුණු යොදමින් ලේඛනයේ යෙදෙයි.<br>• විරාම ලකුණු නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි. | 04 |
| | 4.2<br>පද බෙදීමේ සම්මත රීති අනුගමනය කරමින් ලියයි. | • වචනයක මුලින් යෙදෙන උපසර්ග හා අගින් යෙදෙන ප්‍රත්‍ය, වචනයට එක් කර ලිවීම. | • අර්ථවත් ව පද බෙදා ලිවීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• උපසර්ග, වචනවල මුලට එක්කොට ලියයි.<br>• ප්‍රත්‍ය, වචනවල අගට එක්කොට ලියයි. | 04 |
| 5.0<br>භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | 5.1<br>වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි. | • සමානාර්ථ පද<br>• විරුද්ධාර්ථ පද<br>• විශේෂණ පද<br>• තනි පද | • විවිධ පද වර්ග හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• විවිධ පද වර්ගවල ස්වභාවය විස්තර කරයි.<br>• ලේඛනයේ දී විවිධ පද අර්ථවත් ව භාවිත කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 5.2<br>සාම්ප්‍රදායික යෙදුම් භාෂාමය කාර්යයේ දී උචිත පරිදි භාවිත කරයි. | • රූඪී (ඉඟි වැකි)<br>• ප්‍රස්තාව පිරුළු<br>(ක්‍රියාකාරකම්) | • සාම්ප්‍රදායික යෙදුම් විශේෂයක් වශයෙන් රූඪී හා ප්‍රස්තාව පිරුළු හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• භාෂාව පෝෂණය සඳහා සාම්ප්‍රදායික යෙදුම්වල වැදගත්කම ප්‍රකාශ කරයි.<br>• රූඪී හා ප්‍රස්තා පිරුළු භාවිත කරමින් අදහස් විචිත්‍රවත් ව ඉදිරිපත් කරයි. | 06 |
| | 5.3<br>භාෂා ව්‍යවහාරයේ විවිධතා හඳුනා ගෙන භාෂාව භාවිත කරයි. | • කෘෂි කර්මාන්තය ආශ්‍රිත භාෂා ව්‍යවහාර.<br>- වී ගොවිතැන | • කෘෂි කර්මාන්තය හා බැඳුණු භාෂා ව්‍යවහාරයේ විවිධතා හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• වී ගොවිතැන හා බැඳුණු භාෂා ව්‍යවහාර හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• වී ගොවිතැන ආශ්‍රිත වචන අර්ථවත් ව භාවිත කරයි. | 05 |
| 6.0<br>සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 6.1<br>නාමපද හා එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි. | • වචන භේදය<br>• පුරුෂ භේදය<br>• ලිංග භේදය<br>• උක්ත අනුක්ක භේදය<br>(ක්‍රියාකාරකම්) | • උක්ත නාම පද හා අනුක්ත නාම පද නිදසුන් සහිත ව ඉදිරිපත් කරයි.<br>• නාම පදවල උක්ත හා අනුක්ත භේදය හඳුනා ගෙන වාක්‍යවල යෙදෙයි.<br>• ලේඛනයේ දී උක්ත හා අනුක්ත නාම පද නිවැරදි ව යෙදිය යුතු බව පිළිගනියි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.2<br>ක්‍රියා පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි. | • පූර්ව ක්‍රියා<br>• මිශ්‍ර ක්‍රියා | • ක්‍රියා පද වර්ග කර දක්වයි.<br>• පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා අතර වෙනස පැහැදිලි කරයි.<br>• ලේඛනයේ දී මිශ්‍ර ක්‍රියා පද නිවැරදි ව භාවිත කරයි.<br>• ලේඛනයේ දී පූර්ව ක්‍රියා පද නිවැරදි ව භාවිත කරයි. | 06 |
| | 6.3<br>සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි. | • උක්තය , කර්මය , ආඛ්‍යාතය ගැන සැලකිලිමත් වෙමින් කාල භේදය අනුව වාක්‍ය ලිවීම | • වාක්‍යයක මූලිකාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• උක්තය , කර්මය හා ආඛ්‍යාතය කෙරෙහි සැලකිලිමත් වෙමින් වාක්‍ය ලියයි.<br>• කාල භේදය කෙරෙහි සැලකිලිමත් වෙමින් වාක්‍ය නිර්මාණය කරයි. | 06 |
| 7.0<br>භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි. | 7.1<br>තොරතුරු සන්නිවේදනය සඳහා ලිපි ලියයි. | • රාජකාරි ලිපි<br>• පෞද්ගලික ලිපි (ක්‍රියාකාරකම්) | • රාජකාරි ලිපියක ඇතුළත් මූලිකාංග නම් කරයි.<br>• තොරතුරු සන්නිවේදනය සඳහා ලිපි ලිවීමේ වැදගත්කම විස්තර කරයි.<br>• ලිපි ලිවීමේ දී ශිල්පීය ප්‍රයෝග භාවිත කරයි.<br>• යෝග්‍ය ආකෘති භාවිත කරමින් ලිපි ලියයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.2<br>ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි. | • ආරාධනා පත්‍ර | • ප්‍රායෝගික අවශ්‍යතා සඳහා භාවිත කරන ලේඛන නම් කරයි.<br>• සුදුසු ආකෘති භාවිත කරමින් ආරාධනා පත්‍ර නිර්මාණය කරයි.<br>• අරමුණුවලට ගැළපෙන ලෙස ආරාධනා පත්‍ර නිර්මාණය කරයි.<br>• ආරාධනා පත්‍ර නිර්මාණයේ දී ශිල්පීය ප්‍රයෝග භාවිත කරයි. | 05 |
| 8.0<br>භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි. | 8.1<br>කරුණු සංවිධානය කර ගනිමින් මාතෘකානුකූල ව රචනා ලියයි. | • මාතෘකානුකූල රචනා<br>(විවිධ දත්ත හා අත්දැකීම් පදනම් කර ගනිමින් රචනා ලිවීම) | • නිවැරදි ව රචනා සැකිල්ලක් සකස් කරයි.<br>• නිර්මාණාත්මක ව රචනා ගොඩනගයි.<br>• මාතෘකාවට අදාළ සාරවත් කරුණු ඉදිරිපත් කරමින් රචනා ලියයි.<br>• රචනා ලිවීමේ දී භාෂාව නිවැරදි ව භාවිත කරයි.<br>• රචනා ලිවීමේ දී ශිල්පීය ප්‍රයෝග අනුගමනය කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| භාෂාව නිරවුල් ව හා | 8.2<br>පාඨකයා ආකර්ෂණය වන පරිදි අදහස් ඉදිරිපත් කරමින් නිර්මාණාත්මක ව ලියයි. | • බිත්ති පුවත් පත් ලිපි<br>• සඟරා ලිපි<br>• පුවත්පත් ලිපි<br>(ක්‍රියාකාරකම්) | • බිත්ති පුවත්පත් සහ සඟරා සඳහා නිර්මාණත්මක ලිපි ලියයි.<br>• පාඨකයා ආකර්ෂණය කර ගත හැකි වන පරිදි භාෂාව හසුරුවයි. | 05 |
| 9.0<br>සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි. | 9.1<br>සංස්කෘතික උරුමය හා හර පද්ධති පිළිබඳ ව අවබෝධය ලබා ගැනීම සඳහා ලිපි ලේඛන පරිශීලනය කරයි. | • ශ්‍රී පාදය (සමනල අඩවිය) පිළිබඳ ගද්‍ය විස්තරයක් | • සංස්කෘතික උරුමය යනු කුමක්දැයි පැහැදිලි කරයි.<br>• සංස්කෘතික උරුමය ගැන ලියැවී ඇති ලිපි ලේඛන කියවයි.<br>• සංස්කෘතිය හා හර පද්ධති අගය කරමින් අදහස් දක්වයි.<br>• ශ්‍රී පාදය ගැන ලියැවී ඇති විවිධ නිර්මාණ කියවයි.<br>• ශ්‍රී පාදය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.2<br>පොත පත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි. | ● ලෝකෝපකාරය (තෝරාගත් කවි 4 ක්)<br>● තිරුක්කුරල් (කළගුණ තැකීම - කවි 4 ක්) | ● උපදේශ ග්‍රන්ථවලින් නිරූපිත සාරධර්ම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● සාරධර්ම අර්ථකථනය කරයි.<br>● ප්‍රායෝගික ජීවිතයට සාරධර්ම උපයෝග වන ආකාරය පැහැදිලි කරයි.<br>● උපදේශ ග්‍රන්ථවල ඇතුළත් සාරධර්ම අනුගමනය කරයි. | 06 |
| | 9.3<br>දේශාභිමානී හැඟීම් දනවන සාහිත්‍ය නිර්මාණ ඇසුරු කරයි. | ● දේශාභිමානී ගී<br>- මා දුටු මුල් හිරු පෙන්වූ ලංකා (නන්දා මාලනී) | ● දේශාභිමානී හැඟීම් දනවන පද්‍ය නිර්මාණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● දේශාභිමානී ගීතයෙන් ධ්වනිත වන අදහස් අගය කරයි.<br>● ගීතයේ දේශාභිමානී හැඟීම් දනවන අවස්ථා උපුටා දක්වයි.<br>● " මා දුටු මුල් හිරු පෙන් වූ ලංකා" ගීතය පිළිබඳ රසාස්වාදයක් ඉදිරිපත් කරයි. | 04 |
| | 9.4<br>විවිධ ජන කොටස්වලට අයත් සිරිත් විරිත් හඳුනා ගැනීම සඳහා ලිපි ලේඛන ඇසුරු කරයි. | ● ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනතාව | ● විවිධ ජන කොටස් අතරින් අභිකුණ්ඨික ජනතාවගේ විශේෂත්වය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>● අභිකුණ්ඨික ජනතාවගේ සිරිත් විරිත් පිළිබඳ ලියැවුණු ලිපි ලේඛන කියවයි.<br>● අභිකුණ්ඨික ජනතාවගේ විවිධ සිරිත් විරිත් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● අභිකුණ්ඨික ජනතාව පිළිබඳ තොරතුරු එක්රැස් කරයි.<br>● අභිකුණ්ඨික ජනතාව සතු යහ සිරිත් අගය කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.5<br>විවිධ නායකයන්ගේ චරිත කතා පරිශීලනය කරයි. | • කතෝලික ආගමික නායකයෙක්<br>- එඩ්මන් පීරිස් රදගුරුතුමා | • එඩ්මන් පීරිස් රදගුරුතුමාගේ චරිත කතාව කියවයි.<br>• එඩ්මන් පීරිස් රදගුරුතුමාගේ ජීවන තොරතුරු ඉදිරිපත් කරයි.<br>• එඩ්මන් පීරිස් රදගුරුතුමාගෙන් සමාජයට සිදු වූ සේවය අගය කරයි.<br>• එඩ්මන් පීරිස් රදගුරුතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ ඉදිරිපත් කරයි. | 04 |
| 10.0<br>සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබාගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි. | 10.1<br>සාහිත්‍යික හා දාර්ශනික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන ඇසුරු කරයි. | • ඊ. ඩබ්. අදිකාරම්තුමාගේ දර්ශනය | • ඊ. ඩබ්. අදිකාරම්තුමා පිළිබඳ ලියැවුණු ලිපි ලේඛන කියවයි.<br>• අදිකාරම්තුමා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• දාර්ශනිකයකු වශයෙන් අදිකාරම්තුමාගෙන් සිදු වූ සේවය අගය කරයි. | 04 |
| | 10.2<br>විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොතපත පරිශීලනයෙන් ලබා ගත් දැනුම භාෂා කාර්ය සඳහා යොදා ගනියි. | • පුරාණ ලංකාවේ ලෝහ තාක්ෂණය | • පැරණි ලෝහ තාක්ෂණය ගැන ලියැවුණු ලිපි ලේඛන කියවයි.<br>• ලංකාවේ පැරණි ලෝහ තාක්ෂණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• අතීත ශ්‍රී ලාංකිකයන්ගේ ලෝහ තාක්ෂණික දැනුම අගය කරයි.<br>• ලෝහ තාක්ෂණය පිළිබඳ වාක් කෝෂය අවස්ථානුකූල ව යොදා ගනියි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 11.0<br>රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 11.1<br>සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි | • ජන කවි<br>- තෝරාගත් ජන කවි 8 ක්<br>(සිංහල ජන කවි සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | • ජනකවිවල ස්වභාවය හඳුනා ගෙන විස්තර කරයි.<br>• ජනකවිවලින් ප්‍රකට වන මානව අත්දැකීම් ඉස්මතු කර දක්වයි.<br>• ජනකවි රසාස්වාදයේ යෙදෙයි. | 04 |
| | 11.2<br>සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි. | • නූතන කවි පෙළක්<br>"සිලිලාරෙක හෙල්මැළි" - ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ | • නිර්දිෂ්ට කවි පෙළ ගායනා කරයි.<br>• කවි පෙළෙන් ධ්වනිත වන අදහස් හා හැඟීම් විස්තර කරයි.<br>• කවි පෙළෙහි ගැබ් වූ සාහිත්‍යමය ලක්ෂණ සාකච්ඡා කරයි.<br>• කවි පෙළ රසවින්දනයේ යෙදෙයි. | 04 |
| 12.0<br>අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි. | 12.1<br>පද්‍ය රචනා නිර්මාණය කරයි. | • සරල පද්‍ය නිර්මාණය කිරීම.<br>(ක්‍රියාකාරකම්) | • විවිධ කාව්‍ය නිර්මාණවලට පදනම් වූ අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• කාව්‍ය නිර්මාණයේ දී යොදා ගෙන ඇති කාව්‍ය උපක්‍රම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• විවිධ ආකෘති භාවිත කරමින් කවි නිර්මාණය කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 12.2<br>නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි. | • නිර්මාණාත්මක ප්‍රබන්ධ රචනය (ආදර්ශ නිර්මාණ ඇසුරෙන්)<br>- "පොල් ලද සැටි" (ප්‍රබන්ධ සංග්‍රහය) - කුමාරතුංග මුනිදාස | • අත්දැකීම් හා පරිකල්පනය පදනම් කර ගෙන ප්‍රබන්ධයක සැකිල්ලක් ගොඩ නගයි.<br>• උචිත චරිත තෝරා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>• ප්‍රබන්ධකරණයේ දී භාෂාව නිර්මාණාත්මක ව භාවිත කරයි.<br>• ප්‍රබන්ධ නිර්මාණය කරයි. | 04 |
| | 12.3<br>නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි. | • තමා දුටු සිද්ධියක් ඇසුරෙන් දෙබස් රචනය කිරීම.<br>- සෝමලතා සුබසිංහගේ 'තොප්පි වෙළෙන්දා' නාට්‍ය පෙළ ඇසුරෙන් සකස් කළ පාඩමක් | • නාට්‍යෝචිත අවස්ථා සහිත කතා වස්තුවක් තෝරා ගනියි.<br>• තෝරා ගත් කතා වස්තුවේ නාට්‍යෝචිත අවස්ථා පෙළගස්වයි.<br>• නාට්‍යෝචිත අවස්ථාවක් සඳහා දෙබස් රචනා කරයි. | 04 |

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

## 01. ගොවි බිරියගේ නුවණ

**නිපුණතාව** : **1.0** සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : **1.3** සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රස විඳියි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- ජනකතාවට අවධානයෙන් යුතු ව සවන් දී ප්‍රතිචාර දක්වයි.
- ජනකතාවෙහි රසවත් සිද්ධි මතකයෙන් ඉදිරිපත් කරයි.
- ජනකතාවල ස්වභාවය හා පසුබිම විස්තර කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ජනකතාවල ස්වභාවය හා පසුබිම පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- ජනකතා ජන ප්‍රවාද ලෙස කටින් කට පැවත ගෙන ආ සාහිත්‍යාංගයක් බව පෙන්වා දෙන්න.
- ජනකතා සවන් දීම මගින් ද රස විඳිය හැකි සාහිත්‍යාංගයක් බව පැහැදිලි කරන්න.
- ජනකතා ඇසීමේ දී ජනකතාව කියන අය හා අසන අය අතර සම්බන්ධතාවක් ගොඩ නගා ගන්නා බව පෙන්වා දෙන්න.
- එවැනි අවස්ථාවල දී කතාව පවසන්නාට කතාව අසා ගෙන සිටින්නන්ගේ අවධානය යොමු කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි දේ සාකච්ඡා කරන්න.
  - ප්‍රශ්න ඇසීම
  - මුහුණින් හැඟීම් ප්‍රකාශ වන ආකාරයෙන් කතාව ඉදිරිපත් කිරීම
  - කතාව ඉදිරිපත් කිරීමේ දී අංග චලනය භාවිතය
- එමෙන් ම කතාව අසන්නන්ගෙන් ද අසන කතාව පිළිබඳ ව ප්‍රතිචාර විවධාකාරයෙන් ඉදිරිපත් විය හැකි බව පෙන්වා දෙන්න.
- ශෝකය, බිය, සතුට, පුදුමය, ආදිය අභිනය මගින් ඉදිරිපත් විය හැකි බවත්, එම අභිනයන් සවන් දී දක්වන ප්‍රතිචාර වශයෙන් හැඳින්විය හැකි බවත් පෙන්වා දෙන්න.
- ඊට අමතර ව වාචික ප්‍රතිචාර ද ඉදිරිපත් කළ හැකි බව පෙන්වා දෙන්න.
- නිර්දිෂ්ට ජනකතාවට සවන් දීමට අවස්ථාව සලසන්න.
- සවන් දුන් පසු ප්‍රශ්න නගමින් ප්‍රතිචාර ලබා ගන්න.
- මෙවැනි වෙනත් ජනකතා සොයා ගෙන ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

**මූලික වදන්/ සංකල්ප :**

- ජනකතා - පොදු ජනතාව අතර බහුල වශයෙන් මුඛ පරම්පරාගත ව පවත්නා කථාන්තර (සිංහල ශබ්දකෝෂය 9 කාණ්ඩය)

**ගුණාත්මක යෙදවුම් :**

- නගුල් මුන්නා සහ තවත් කතා - ඒ. පී. ගුණරත්න
- මග දිගට ජනකතා (1 හා 2) - ඩී. පී. වික්‍රමසිංහ

**ඇගයීම තක්සේරුකරණය :**

- ජනකතාවට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- ජනකතාවලින් ඉස්මතු වන ආදර්ශ අගය කරමින් කතා කරයි.
- ජනකතා එකතුවක් සකස් කරයි.
- සාවධාන ව සවන් දීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.

ඇමුණුම 1

**පහත සඳහන් අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.**

1. ජනකතාවක් පන්තියට ඉදිරිපත් කර එමගින් ඉස්මතු වන ආදර්ශ පෙන්වා දෙන්න.
2. ආදර්ශවත් ජනකතා එකතුවක් පිළියෙල කරන්න.

## 02. ප්‍රස්තාව පිරුළු හා ඉඟි වැකි

**නිපුණතාව** : 5.0 භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : 5.2 සාම්ප්‍රදායික යෙදුම් භාෂාමය කාර්යයේ දී උචිත පරිදි භාවිත කරයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- සාම්ප්‍රදායික යෙදුම් විශේෂයක් වශයෙන් රූඪී හා ප්‍රස්තාව පිරුළු හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- භාෂාව පෝෂණය සඳහා සාම්ප්‍රදායික යෙදුම්වල වැදගත්කම ප්‍රකාශ කරයි.
- රූඪී හා ප්‍රස්තාව පිරුළු භාවිත කරමින් අදහස් විචිත්‍රවත් ව ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ප්‍රස්තාව පිරුළු ගොඩනැගී ඇත්තේ ජනකතා ජන ප්‍රවාද හෝ විවිධ සිද්ධි හෝ පදනම් කරගෙන බව පැහැදිලි කරන්න.
- ව්‍යක්ත ලෙස අදහස් ප්‍රකාශනයේ දී එවැනි කියමන් යොදා ගත හැකි බව පැහැදිලි කරන්න.
- අදහස් රසවත් ව හා අර්ථවත් ව ඉදිරිපත් කිරීම සඳහා රූඪී හා ප්‍රස්තාව පිරුළු යොදා ගත හැකි බව පැහැදිලි කරන්න.
- ප්‍රස්තාව පිරුළු ගොඩනැගී ඇති ආකාර පිළිබඳ පහත සඳහන් කරුණු ඇසුරෙන් සාකච්ඡා කරන්න.

- **ජනකතා ඇසුරෙන් ගොඩ නැගුණු ප්‍රස්තාව පිරුළු**
  - පුහුල් හොරා කරෙන් දැනේ
  - කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ
  - ගඟට ඉනි කැපුවා වගේ.
  - ලබ්බේ කංකාරිය වගේ.

- **ජන ප්‍රවාද ඇසුරෙන් පැන නැගී ඇති ප්‍රස්තාව පිරුළු**

  - රයිගමයයි ගම්පොළයයි වගේ
  - පරංගියා කෝට්ටෙ ගියා වගේ

- **විවිධ සිද්ධි ඇසුරෙන් පැන නැගී ඇති ප්‍රස්තාව පිරුළු**
  - ලබ්බ පොළොවේ ගැහුවා වගේ
  - ඉද්ද ගැහුවා වගේ
  - වෙඩි කාපු ඌරා වගේ
- රූඪී ( **ඉඟි වැකි)** කිහිපයක් ඉදිරිපත් කර ඒවා භාෂාවේ යෙදෙන ආකාරය පිළිබඳ ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.

  උදා :
  - මුහුණේ දැලි ගෑවුණා
  - කරල පැහුණා

– ඉහේ මලක් පිපුණා
– ලැල්ලට පැගුවා
– හින් දාඩිය දැම්මා
– කොට උඩ ගියා

**මූලික වදන්/සංකල්ප :**

- ප්‍රස්තාව පිරුළු - අත්දැකීම් සම්භාරයක් කැටි කළ කෙටි යෙදුම්.
  (ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය - හරිස්චන්ද්‍ර විජයතුංග)
- රූඩී - අමුතුවෙන් ආරෝපණය කළ අර්ථය රූඩී ය යි.
  (ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය - හරිස්චන්ද්‍ර විජයතුංග)

**ගුණාත්මක යෙදවුම් :**

- පිරුළු මිණි, - පී. ඇස්. ධර්මබන්දු
- ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය - හරිස්චන්ද්‍ර විජයතුංග

**ඇගයීම තක්සේරුකරණය :**

- ප්‍රස්තාව පිරුළු හා රූඩී හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ප්‍රස්තාව පිරුළු හා රූඩී අවස්ථෝචිත ව භාවිත කරයි.
- නිර්මාණාත්මක ලේඛනයේ දී ප්‍රස්තාව පිරුළු හා රූඩී භාවිත කරයි.
- ප්‍රස්තාව පිරුළු හා රූඩී එක් රැස් කරයි.

ඇමුණුම 1

**අභ්‍යාස**

- පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළුවලින් ප්‍රකාශ වන අදහස් ඉදිරිපත් කරන්න.
  - කළුවා මාරපන ගියා වාගෙයි.
  - කපන්න බැරි අත ඉඹිනවා වාගෙයි.
  - ලෙඩ කපුටෝ වැල කනවා වාගෙයි.
  - අබරා සිල් ගත්තා වාගෙයි.

- පහත සඳහන් රූඩීවලින් පළවන අරුත් පැහැදිලි කරන්න.
  - අනුන්ගේ පානෙන් එළිය බලනවා
  - අඬබෙර ගහනවා
  - අනූනවයෙන් බේරුණා
  - උගුරට හොරා බෙත් කනවා
  - තරු පෙනුණා

- ප්‍රස්තාව පිරුළු හා රූඩී එක් රැස් කර පොත් පිංචක් සකස් කරන්න.

## 03. සරණංකර සඟරජ තෙරණුවෝ

**නිපුණතාව** : **1.0** සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 1.1 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී ප්‍රතිචාර දක්වයි

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- සවන් දීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු විස්තර කරයි.
- සවන් දී ග්‍රහණය කර ගත් කරුණු ඉදිරිපත් කරයි.
- අවධානයෙන් හා අවබෝධයෙන් සවන් දීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- සවන් දුන් කතාවෙන් ගත හැකි ජීවිතාදර්ශ විස්තර කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පහත සඳහන් කරුණු අවධාරණය කරමින් සවන් දීම පිළිබඳ සාකච්ඡාවක නිරතවන්න.
- සවන් දීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු :
  - අවධානය
  - අවබෝධය
  - සංයමය
- සවන් දී කරුණු මතක තබා ගත හැකි ක්‍රම
  - කෙටි සටහන් තබා ගැනීම
  - සවන් දුන් කරුණු නැවත ආවර්ජනය කිරීම
- ඇමුණුමෙහි සඳහන් කතා පුවත (නිහතමානී සංඝරාජ තෙරණුවෝ) සුදුසු ක්‍රමවේදයක් මගින් ශිෂ්‍යයන්ට දෙවරක් සවන් දීමට සලස්වන්න.
- පාඩමට සවන් දුන් පසු පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ශිෂ්‍යයන්ගෙන් ලබා ගන්න. (සවන් දීමට පෙර ඒවා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.)

1. සරණංකර හිමියන් උපන් වර්ෂය
2. සරණංකර හිමියන් උපන් ස්ථානය
3. සරණංකර හිමියන්ට පාලි භාෂාව ඉගැන්වූ ගුරුවරු දෙදෙනා
4. සරණංකර හිමියන් විසින් ලියන ලද ග්‍රන්ථ දෙකක්
5. සරණංකර හිමියන් පිණ්ඩපාතික සරණංකර හිමි නමින් හැඳින්වීමට හේතුව
6. සරණංකර හිමියන්ගේ මූලිකත්වයෙන් ගොඩනගන ලද පිරිවෙන් දෙකක්
7. සරණංකර හිමියන්ගේ සමයේ ලක්දිවට උපසම්පදාව ගෙන ආ රට
8. ලක්දිව ප්‍රථම සඟරජ පදවිය ලැබුණු බව දැන ගත් පසු සරණංකර හිමියන් මුලින් ම කළ දේ

**ගුණාත්මක යෙදවුම් :**

- සරණංකර හිමියන් පිළිබඳ පොත පත

**ගුරුභවතාගේ අතිරේක පරිශීලනය සඳහා -**

- සරණංකර සංඝරාජ සමය - කොටගම වාචිස්සර හිමි

ඇගයීම හා තක්සේරුකරණය :

- සංයමයෙන් හා අවධානයෙන් යුතු ව සවන් දී ප්‍රතිචාර දක්වයි.
- සවන් දෙමින් සටහන් තබා ගනී.
- අසන ලද ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලබා දෙයි.
- සවන් දී ග්‍රහණය කර ගත් කරුණු ඉදිරිපත් කරයි.

ඇමුණුම 1 :

**නිහතමානී සංඝරාජ තෙරණුවෝ**

මධ්‍යම පළාතේ, උඩරට වැලිවිට තුම්පනේ නමැති ගෙමෙහි, ක්‍රි. ව. 1698 වර්ෂයේ දී කුලතුංග බණ්ඩාර නමින් කුල කුමරුවෙක් උපත ලැබී ය. හේ කුඩා කල සිට ම පින්වන්ත ය. සිල්වත් ය. සැදැහැවත් ය. නිති පන්සිල්, පොහොය අටසිල් රැක්කේ ය. කුඩා අවදියේ සිට ම පළ කළ මේ ලක්ෂණ නිසා සොළොස්වන වියේ දී ම, සූරියගොඩ විහාරයේ දී සරණංකර නමින් පැවැදි බව ලැබීමට තරම් මේ කුමරා වාසනාවන්ත විය.

සරණංකර හිමි වැඩ විසූ සෙංකඩගලපුර සමය ලක් ඉතිහාසයේ හැම අතින් ම පිරිහුණ කාල වකවානුවක් විය. මෙරට පාලනය කළෝ යුරෝපා ජාතීහු ය. ලක් වැසියාට විවිධ තර්ජන එල්ල විණි. පන්සල් පිරිහිණි. භික්ෂූහු විරල වූහ. මේ අඳුරු සමයට ආලෝකයක් ලබා දීමට සමත් එකම යුග පුරුෂයාණන් වූයේ, වැලිවිට සරණංකර හිමියන් යැයි කීම සත්‍යයකි.

සාමණේර අවදියේ සිට ම උන්වහන්සේ වෙත දැඩි ශාස්ත්‍ර පිපාසයක් දක්නට ලැබිණ. ගුරුවරුන් සොයා ගමක් ගමක් පාසා යන්නට විය. බාලාවතාර නම් වූ පාලි ව්‍යාකරණ පොතේ මුල් කොටස උන් වහන්සේ උගත්තේ එකල සිරගත ව සිටි මාකෙහෙල්වල ලෙව්කේ රාල නම් ගුරුවරයෙකුගෙනි. එහි ඉතිරි කොටස පල්කුඹුරේ අත්ථදස්සි හිමියන්ගෙන් උගත්තේ ය. එතැන් සිට උන්වහන්සේ නිරන්තරයෙන් ම ශාස්ත්‍රෝද්ග්‍රහණයේ නියැලුණහ.

මෙසේ ආයාසයෙන් ධර්මශාස්ත්‍ර උගත් ගිහි පැවිදි බොහෝ දෙනෙකුගේ ඒකරාශී වීමක් මෙකල දක්නට ලැබිණ. පසු ව එය 'සිල්වත් සමාගම' නමින් ප්‍රකට විය. ඊට සමගාමී ව ශ්‍රේෂ්ඨ පඬිවරු පිරිසක් ද බිහි වූහ.

ඉගෙනීමට රුචියක් දැක් වූ අයගේ ශාස්ත්‍ර පිපාසය සංසිඳුවීම සඳහා සරණංකර හිමියෝ සිංහල හා පාලි පොත් ලිවීමට පටන් ගත්හ. 'සාරාර්ථ සංග්‍රහය' උන්වහන්සේගේ පළමු වන ග්‍රන්ථය යි. 'සත්ථා' නම් වූ බුදු ගුණය එමගින් විග්‍රහ විය. සිදත් සඟරාව, රූපමාලාසංදේශය, මුනිගුණ අලංකාරය, එළු බෝධිවංශය හා භෛෂජ්ජ මංජුසාව උන්වහන්සේ විසින් සංස්කරණය කරන ලද ග්‍රන්ථ අතර වෙයි.

එකල සිටි සාමනේරයන් වහන්සේලාට ධර්ම ශාස්ත්‍ර ඉගැන්වීමට ද සරණංකර හිමියන්ට අවශ්‍ය විය. ඒ සඳහා පිරිවෙන් ආරම්භ කිරීමට උන්වහන්සේ උත්සුක වූහ.

නියමකන්ද පිරිවෙන ගොඩනැගූ උන්වහන්සේ, ගඩලාදෙණිය ධර්මතිලක විහාරස්ථානයෙහි ද පිරිවෙනක් ආරම්භ කළහ. එය ධර්මකීර්ත්‍යාරාම පිරිවෙන නම් විය. ගිහි පැවිදි දෙපිරිසට ම දහම් අධ්‍යාපනය ලබා දීම මෙමගින් සිදු විය. මේ නිසා 'රාජගුරු' යන ගෞරව නාමයෙන් පිදුම් ලැබීමට ද උන්වහන්සේට හැකි විය. රත්මලානේ පරමධර්මචේතිය පිරිවෙන ද උන්වහන්සේ විසින් ගොඩනගන ලද්දක් ය යන්න ප්‍රකට ය. මේ පිරිවෙන් මගින් විශාල ධර්ම ශාස්ත්‍ර පුනරුදයක් ඇති කිරීමට හැකි විය.

සුපේෂල ශික්ෂාකාමී අල්පේච්ඡ ජීවිතයක් ගත කළ සරණංකර හිමියන් පැවිදි වූ දා සිට ම යැපුණේ පිඬු සිගා යෑමෙනි. එහෙයින් 'පිණ්ඩපාතික සරණංකර' නම් විය. ගමින් ගමට වඩිමින්, දහම් දෙසමින්, අසරණයන්ට පිහිට වූ හෙයින් 'අසරණ සරණ සරණංකර' නමින් ද උන්වහන්සේ ප්‍රචලිත වූහ.

මේ අතර ඉන්දියාවේ සිට බමුණු පඬිවරයෙක් මහනුවර රාජවාසලට පැමිණියේ ය. ඔහු සමග සාකච්ඡා කිරීමට තරම් උගත් කිසිවෙක් එකල මෙහි නො වී ය. රජතුමා වහා ම සරණංකර හිමියන් රාජ වාසලට ගෙන්වී ය. බමුණු පඬිවරයා සරණංකර හිමියන්ගේ පාණ්ඩිත්‍යය පිළිබඳ ව පැහැදී ප්‍රශංසා කළේ ය. රජතුමා ඇතුළු සියල්ලෝ ම සරණංකර හිමියන් කෙරෙහි පැහැදුණහ.

උපසපන්වීමේ මහත් අභිලාශයෙන් පෙළුණු උන්වහන්සේට එය සාධනය කර ගත නො හැකි වූයේ මෙරට උපසම්පදාව ලැබූ භික්ෂූන් වහන්සේ නො වූ හෙයිනි. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ උදව් ඇති ව උපසම්පදාව ගෙන ඒම සඳහා සරණංකර හිමියන් විසින් සියම් රටට (තායිලන්තයට) දූත පිරිසක් යවන ලද්දේ මේ සඳහා ය.

සියම් රජතුමා උපාලි මහ තෙරුන් ප්‍රමුඛ උපසපන් භික්ෂූන් වහන්සේලා විසි නමක් මෙහි එවූ අතර එමගින් මෙරට උපසම්පදාව පිහිටුවිණි. 'සියම් උපාලි' යන නමින් මෙරට 'ශ්‍යාමෝපාලි' නිකාය (සියම් නිකාය) ආරම්භ වූයේ ඒ අයුරිනි.

'මගෙනුත් වැඳුම් පිදුම් ලබන්නට කෙනෙකු මෙහි සිටිය යුතු ය' යන අදහසින් සරණංකර හිමියන් මෙහි දී උපසම්පදා වූයේ දෙවැනියා ලෙස ය. උන්වහන්සේ එතරම් අනතිමානී ගුණයෙන් යුතු කෙනෙක් වූ බව ඉන් පැහැදිලි ය. අනතුරු ව කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා උන්වහන්සේට ලක්දිව ප්‍රථම සඟ රජ පදවිය පිරිනැමී ය. එය දැන ගත් විගස උන්වහන්සේ 'උඩගු නොව මහණ' යනුවෙන් පන්සලේ දොර උළුවස්ස් මත තෙවරක් ලියා තැබූ බව කියැවේ.

වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ රාජගුරු සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ ලක්දිවට විශාල මෙහෙවරක් ඉටු කළ භික්ෂූන් වහන්සේ නමකි. දේශයේ අවාසනාවට මෙන් ක්‍රිස්තු වර්ෂ 1778 දී උන්වහන්සේ අපවත් වී වදාළහ.

- සංස්කාරක මණ්ඩලය -

## 04. සමානාර්ථ පද

**නිපුණතාව** : 5.0 භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල :**

- සමානාර්ථ පද හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- සමානාර්ථ පදවල ස්වභාවය විස්තර කරයි.
- ලේඛනයේ දී සමානාර්ථ පද අර්ථවත් ව භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- සිංහල භාෂාවේ භාවිත විවිධ පද වර්ග හඳුන්වා දීම සඳහා පහත දී ඇති සටහන ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න.
  - කුඩා - පුංචි
  - උසස් - පහත්
  - අඳුරු සමය, දුෂ්කර පළාත්
  - පිඬු සිඟා යැපෙන - පිණ්ඩපාතික

- ඒ ඇසුරෙන් පහත සඳහන් එක් එක් පද වර්ගය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
  1. සමානාර්ථ පද
  2. විරුද්ධාර්ථ පද
  3. විශේෂණ පද
  4. තනි පද

- සමානාර්ථ පද යනු සමාන තේරුම් ඇති පද බව හඳුන්වා දෙන්න.
  උදා :
  අහස - අඹර, ගගන
  සාගරය - සිඳු, සයුර, මුහුද

- ඇමුණුම 1හි සඳහන් අභ්‍යාසයෙහි සිසුන් නිරත කරවන්න.
- පෙළ පොතෙහි පාඩමේ සඳහන් වචන ආශ්‍රයෙන් සමානාර්ථ පද පිළිබඳ දැනුම තහවුරු කිරීම සඳහා අභ්‍යාසයක සිසුන් නිරත කරවන්න.

**මූලික වදන්/ සංකල්ප :**

- වාක්කෝෂය - කෙනෙකු දන්නා වචන සංඛ්‍යාව

**ගුණාත්මක යෙදවුම් :**

- සමානාර්ථ පද ශබ්දකෝෂය - සෝමපාල ජයවර්ධන
- විරුද්ධාර්ථ පද කෝෂය - ඩබ්. එස්. කරුණාතිලක

ඇගයීම හා තක්සේරුකරණය :

- සිංහල භාෂාවේ භාවිත වන පද වර්ග නම් කරයි.
- සමානාර්ථ පද පැහැදිලි කරයි.
- සමානාර්ථ පදවලට නිදසුන් ඉදිරිපත් කරයි.
- පාඩමෙන් තෝරා ගත් පදවලට සමානාර්ථවත් පද ලියයි.

ඇමුණුම 1

- පහත සඳහන් පදවලට සමානාර්ථවත් පද දෙක බැගින් දී ඇති කොටුවෙන් තෝරා ලියන්න.

1. ජලය ..............................................
2. ආලෝකය ..............................................
3. උතුම් ..............................................
4. කැලෑව ..............................................
5. ගස ..............................................
6. මුහුණ ..............................................
7. ලෝකය ..............................................
8. රත්තරන් ..............................................
9. සිත ..............................................
10. සුදු ..............................................

| |
|---|
| දිය, ශ්වේත, රන්, ජගත්, මනස, ධවල, චිත්තය, කනක, රුක, බැද්ද, දිය, වෘක්ෂය වනය, පවර, ශ්‍රේෂ්ඨ, වචන, එළිය, කිරණ, පැන්, වත |

## 05. සිංහල අක්ෂර මාලාව

**නිපුණතාව** : 3.0 සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 3.1 සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල :**

- අක්ෂර මාලාව හඳුනා ගෙන නිවැරදි ව අනු පිළිවෙළින් ඉදිරිපත් කරයි.
- අක්ෂර මාලාව ස්වර, ව්‍යඤ්ජන වශයෙන් වර්ග කර දක්වයි.
- අක්ෂර මාලාව නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- ලේඛනයේ දී අක්ෂර නිවැරදි ව භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- සිංහල අක්ෂර මාලාව ලියූ පුවරුවක් ප්‍රදර්ශනය කර ශිෂ්‍යයන්ගේ මතකය අවදි කරන්න.
- පහත සඳහන් කරුණු වෙත ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- අක්ෂර මාලාව ප්‍රධාන කොටස් 2කට බෙදෙයි.
  ස්වර - 18
  ව්‍යංජන - 42
- අක්ෂර මාලාව අකුරු පිළිවෙළින් නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව සලස්වන්න.
- සිංහල අකුරු නිවැරදි ව ලිවීමේ ක්‍රමවේදය හඳුන්වා දෙන්න.
- සිංහල අක්ෂර මාලාව නිවැරදි අනුපිළිවෙළින් මතකයෙන් ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- අක්ෂර මාලාවේ ස්වර සහ ව්‍යංජන අක්ෂර වෙනස පිළිබඳ ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න.
- ඇමුණුම 1හි සඳහන් අභ්‍යාසවල ශිෂ්‍යයන් නිතර කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සිංහල අක්ෂර මාලාව ලියන ලද පුවරුවක්
- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල අක්ෂර ලිවීම සඳහා මාර්ගෝපදේශ - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

**ඇගයීම තක්සේරුකරණය :**

- සිංහල අකුරු නිවැරදි ව ලියයි.
- අක්ෂර මාලාව නිවැරදි අනුපිළිවෙළින් මතකයෙන් කියයි.
- අක්ෂර මාලාව නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- සිංහල අක්ෂර මාලාව, ස්වර හා ව්‍යංජන වශයෙන් වෙන් කර ලියයි.

ඇමුණුම 1

**පහත සඳහන් සටහනෙහි හිස් කොටු සම්පූර්ණ කරන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | | | | | ඊ |
| | | ඍ | | | |
| | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අඃ | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ක | | | | | |
| | | | | | |
| | | | | | ඬ |
| | | | | | |
| ප | | | | | |
| | | | ව | | |
| | | | | | ෆ |

## 06. අක්ෂර වින්‍යාසය

**නිපුණතාව** : 3.0 සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 3.2 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල :**

- ලිවීමේ දී නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිතයේ වැදගත්කම පැහැදිලි කරයි.
- න, ණ, ල, ළ, ශ, ෂ, ස අකුරු නිවැරදි ව යොදයි.
- සඤ්ඤක අක්ෂර නිවැරදි ව භාවිත කරයි.
- අල්ප ප්‍රාණ සහ ඊට අදාළ මහා ප්‍රාණ අක්ෂර නිවැරදි ව භාවිත කරයි.
- ලිපි ලේඛනවල අක්ෂර වින්‍යාසය නිවැරදි කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ලිවීමේ දී අක්ෂර වින්‍යාසය භාවිත කිරීමේ අවශ්‍යතාව පහත සඳහන් කරුණු ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.
  - නිවැරදි අකුරු නිවැරදි පිළිවෙළට යෙදීම අක්ෂර වින්‍යාසය යි.
  - නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිතයෙන් භාෂාවේ අනන්‍යතාව සුරැකෙයි.
  - වැරදි අර්ථ මතු වීම වැළකෙයි.
  - ලේඛනයේ ව්‍යක්තභාවය සුරැකෙයි.
  - විශේෂයෙන් න, ණ, ල, ළ, ශ, ෂ, ස අකුරු වචනවල යෙදීමේ දී සැලකිලිමත් විය යුතු වේ.
  - සිංහල අක්ෂර මාලාවේ සඤ්ඤක අක්ෂර 5කි.
    ඟ, ඦ, ඬ, ඳ, ඹ
  - අදාළ ස්ථානවල සඤ්ඤක අක්ෂර නොයෙදීමෙන් වචනවල අර්ථ වෙනස් වේ.

| | |
|---|---|
| උදා : අගල | අඟල |
| අඩ | අඬ |
| ඇද | ඇඳ |
| අබ | අඹ |

- සිංහල අක්ෂර මාලාවේ අල්ප ප්‍රාණ අක්ෂර 10ක් ඇත. ඊට අනුරූප මහා ප්‍රාණ අක්ෂර 10ක් ද ඇත.
- අල්ප ප්‍රාණ, මහා ප්‍රාණ අක්ෂර නිවැරදි ව භාවිත කිරීම ලේඛනයේ ව්‍යක්තභාවය සඳහා අවශ්‍ය වේ.
  ඡන්දය - චන්දය

- ඉහත සඳහන් කරුණු පිළිබඳ ව ශිෂ්‍යයන් දැනුවත්කර පෙළ පොතේ සඳහන් අභ්‍යාසවල නිරත කරවන්න.
- ඇමුණුම 1හි සඳහන් ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් ශිෂ්‍යයන් නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිතයට හුරු කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය - ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
- ඇමුණුම 1හි සඳහන් කාර්ය පත්‍රිකාව

ඇගයීම හා තක්සේරුකරණය :

- නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිත කරමින් වචන ලියයි.
- අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- විවිධ ලිපි ලේඛනවල අක්ෂර වින්‍යාසය නිවැරදි කරයි.
- අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කිරීම පිළිබඳ ව අන්‍යයන් දැනුවත් කරයි.

ඇමුණුම 1

1 පහත සඳහන් වචන මාලාව අසා ලිවීමට සලස්වන්න.

(අ ) 1. දර්ශනය — 6. තරුණයා
2. ප්‍රදර්ශනය — 7. පරීක්ෂණය
3. ලේඛනය — 8. බළලා
4. වළල්ල — 9. වරල
5. කසල — 10. පළල

(ආ) 1. ලේකම් — 6. ගාථාව
2. ඛනිජ — 7. සභාව
3. ශීඝ්‍රගාමී — 8. ප්‍රතිඵල
4. විශිෂ්ට — 9. අපලය
5. ආගාධය — 10. බාධාව

2. පහත සඳහන් වචනවල හිස්තැනට සුදුසු අකුර රවුමෙන් තෝරා ලියන්න.

1. ආදර් ..... ය — 6. .... මයා
2. ප්‍රදර්..... නය — 7. හා ......
3. කාර ..... ය — 8. කර .....
4. පර .... — 9. කකු .....
5. දේශ ...... ය — 10. පත.........

ණ න ක
ල ළ ශ
ෂ

3. හිස්තැනට සුදුසු අකුර ඉදිරියේ ඇති රවුමෙන් තෝරා ලියන්න.

1. අ ...... ල — 6. ඇ .... ය
2. කැ ..... — 7. හෙණ් ..... ව
3. ක ...... ය — 8. ඇ ..... ම
4. හ ..... — 9. ස .... ල
5. ක ..... ල — 10. ඇ ..... ලයා

ද ඬ ඟ බ
ඹ ඳු ඩ
ඳ ඬු ග

4. පහත සඳහන් ඡේදයේ අක්ෂර වින්‍යාසය සදොස් තැන් නිදොස් කරන්න.

මිනිසා කවර කාළයක ලොව පහල වුව ද එසේ පහළ වූ දා සිට සොයාගත් සියළු දේ අතරින් ද නිර්මාණය කරගත් සියලු දේ අතරින් ද සුවිශේෂ ව නිර්මාණය වන්නේ භාශාව යි. මිනිසා භාෂාව සොයා ගත්තේ කිනම් කාලයේ දැයි නිස්චිත ව ම විස්තර කළ නො හැකි වුවත් එය මිනිසාගේ විශිෂ්ඨතම නිර්මාණය යි.

**ඇමුණුම 2**

**මහා ප්‍රාණ අක්ෂර**

වර්ගාක්ෂරවල දෙවන තීරුවේ සහ හතර වන තීරුවේ අකුරු මහා ප්‍රාණ අක්ෂරයි .

| | | | | |
|---|---|---|---|---|
| 'ක' වර්ගය - | ක | ඛ | ග | ඝ |
| 'ච' වර්ගය - | ච | ඡ | ජ | ඣ |
| 'ට' වර්ගය - | ට | ඨ | ඩ | ඪ |
| 'ත' වර්ගය - | ත | ථ | ද | ධ |
| 'ප' වර්ගය - | ප | ඵ | බ | භ |

**අල්ප ප්‍රාණ අක්ෂර**

වර්ගාක්ෂරවල පළමු වන තීරුවේ සහ තුන් වන තීරුවේ අකුරු අල්ප ප්‍රාණ අක්ෂර නම් වේ.

| | | | | |
|---|---|---|---|---|
| 'ක' වර්ගය - | ක | ඛ | ග | ඝ |
| 'ච' වර්ගය - | ච | ඡ | ජ | ඣ |
| 'ට' වර්ගය - | ට | ඨ | ඩ | ඪ |
| 'ත' වර්ගය - | ත | ථ | ද | ධ |
| 'ප' වර්ගය - | ප | ඵ | බ | භ |

**සඤ්ඤක අක්ෂර**

අක්ෂර මාලාවේ වර්ගාක්ෂරවලට පසු ව හය වන තීරුවෙහි දැක්වෙන්නේ සඤ්ඤක අක්ෂර යි. අර්ධ අනුනාසික්‍ය යනු ද සඤ්ඤක අක්ෂරවලට තවත් නමකි.

ඟ ඦ ඬ ඳ ඹ

## 07. ඔයිරයිරේ ඔයි රාමා (වී ගොවිතැන)

**නිපුණතාව** : 5.0 භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : 5.3 භාෂා ව්‍යවහාරයේ විවිධතා හඳුනා ගෙන භාෂාව භාවිත කරයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල :**

- කෘෂි කර්මාන්තය හා බැඳුණු භාෂා ව්‍යවහාරයේ විවිධතා හඳුනා ගෙන පැහැදිලි කරයි.
- වී ගොවිතැන හා බැඳුණු භාෂා ව්‍යවහාර හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- වී ගොවිතැන ආශ්‍රිත වචන අර්ථවත් ව භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- සිංහල භාෂාවේ විවිධ ව්‍යවහාර ඇති බව පැහැදිලි කරන්න.
  උදා : ප්‍රාදේශීය ව්‍යවහාර, වෘත්තීන්හි යෙදෙන භාෂා (පරිමිත භාෂා)
- පෙළ පොතේ අදාළ පාඩම කියවා වී ගොවිතැන ආශ්‍රිත ව්‍යවහාර හඳුනා ගැනීමට අවස්ථාව සලස්වන්න.
- වී ගොවිතැන හා සම්බන්ධ වචන ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- එවැනි වචන එක්රැස් කිරීමට යොමු කරන්න.
- ඒවායේ අර්ථ සාකච්ඡා කරන්න.
- වී ගොවිතැන හා බැඳුණු ව්‍යවහාර ඇතුළත් වාක්‍ය නිර්මාණය කිරීමට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- වී ගොවිතැන නිරූපණය වන පින්තූර/වීඩියෝ දර්ශන
- වී ගොවිතැන හා බැඳුණු වචන ලැයිස්තුවක්
- වී ගොවිතැන පිළිබඳ පොත පත

**ඇගයීම හා තක්සේරුකරණය :**

- වී ගොවිතැන හා බැඳුණු වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- වී ගොවිතැන ආශ්‍රිත ව්‍යවහාර එක්රැස් කරයි
- වී ගොවිතැන ආශ්‍රිත ව්‍යවහාරවල අර්ථ දක්වයි.
- වී ගොවිතැන ආශ්‍රිත වචන/ව්‍යවහාර යොදා වාක්‍ය නිර්මාණය කරයි.

## 08. නාම පද

**නිපුණතාව** : **6.0** සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : **6.1** නාම පද හා එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 06 යි.

**ඉගෙනුම් පල :**

- නාම පදවල වචන, පුරුෂ හා ලිංග භේදය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නාම පදවල වචන, පුරුෂ හා ලිංග භේදය භාෂාවේ යෙදෙන ආකාරය පැහැදිලි කරයි.
- නාම පදවල වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය සලකමින් වාක්‍ය නිර්මාණය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- නාම පද හඳුන්වා දී ඒවායේ විවිධ ස්වරූප ඇති බව පැහැදිලි කරන්න.
- ඒක වචන හා බහු වචන (සංඛ්‍යා භේදය), පුරුෂ භේදය, ලිංග භේදය උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

| ඒක වචන | බහු වචන |
|---|---|
| වැද්දා | වැද්දෝ |
| ලේනා | ලේන්නු |
| අලියා | අලි |

- පෙළ පොතේ අදාළ පාඩමෙන් තවත් උදාරණ ඉදිරිපත් කරන්න.
- ඒක වචන හා බහු වචන පද යොදා වාක්‍ය නිර්මාණය කිරීමේ අභ්‍යාසවල නිරත කරවන්න.
- නාම පදවල ඒක වචන හා බහු වචන භේදය අනුව ආඛ්‍යාතය වෙනස් වන ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න. මේ සඳහා හිස් තැන් පිරවීම, නිවැරදි පදය තේරීම වැනි අභ්‍යාස යොදා ගන්න.
- නාම පදවල පුරුෂ භේදය උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

| වචනය | උත්තම පුරුෂ | මධ්‍යම පුරුෂ | ප්‍රථම පුරුෂ |
|---|---|---|---|
| ඒක වචන | මම | නුඹ | ඔහු |
| බහු වචන | අපි | නුඹලා | ඔවහු |

- පුරුෂත්‍රයට අදාළ නාම පද යොදා වාක්‍ය නිර්මාණය කිරීමට සලස්වන්න.
- එහි දී ආඛ්‍යාතය වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න.
- උදාහරණ ඇසුරෙන් නාම පදවල ලිංග භේදය පැහැදිලි කරන්න.

| පුරුෂ ලිංග | ස්ත්‍රී ලිංග |
|---|---|
| කුකුළා<br>බමුණා<br>මිනිසා<br>අශ්වයා | කිකිළි<br>බැමිණි<br>ගැහැනිය<br>වෙළඹ |

- ලිංග භේදය අනුව නාම පද වර්ග කර පෙන්වන්න.
- ලිංග භේදය අනුව ආඛ්‍යාතය වෙනස් වන ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
- වාක්‍ය නිර්මාණය සඳහා අභ්‍යාසවල නිරත කරවන්න.

**මූලික වදන්/ සංකල්ප :**

- ඒක වචන/බහු වචන - සංඛ්‍යා භේදය එකක් පමණක් ගැන කියැවෙන්නේ ඒක වචන, ඊට වැඩි ගණනක් නම් බහු වචන
- ස්ත්‍රී ලිංග - ස්ත්‍රී වාචී බවක් හැඟවෙන්නේ නම් ස්ත්‍රී ලිංග යි.
- පුරුෂ ලිංග - පුරුෂ වාචී බවක් හැඟවන්නේ නම් පුරුෂ ලිංග යි.

**ගුණාත්මක යෙදවුම් :**

- නාම පදයක වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය නිරූපණය වන වගුවක්.
- වාක්‍ය ලැයිස්තුවක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නාම පදවල විවිධ රූප හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය අනුව නාමපද වගුගත කරයි.
- වචන භේදය හා පුරුෂ භේදය හඳුනා ගෙන නිවැරදි ව වාක්‍ය ලියයි.
- ලිංග භේදය අනුව ආඛ්‍යාතය නිවැරදි ව යොදා වාක්‍ය ලියයි.

## 09. ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනතාව

**නිපුණතාව** : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 9.4 විවිධ ජන කොටස්වලට අයත් සිරිත් විරිත් හඳුනා ගැනීම සඳහා ලිපි ලේඛන ඇසුරු කරයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල :**

- විවිධ ජන කොටස් අතරින් අභිකුණ්ඨික ජනතාවගේ විශේෂත්වය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අභිකුණ්ඨික ජනතාවගේ විවිධ සිරිත් විරිත් හඳුනා ගෙන විස්තර කරයි.
- අභිකුණ්ඨික ජනතාව සතු යහ සිරිත් අගය කරයි.
- අභිකුණ්ඨික ජනතාව පිළිබඳ තොරතුරු එක්රැස් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පෙළ පොතේ ඇතුළත් අභිකුණ්ඨික ජනතාව පිළිබඳ ලියැවුණු පාඩම කියවා එම ජනතාවගේ සිරිත් විරිත් පිළිබඳ තොරතුරු ගවේෂණයට ශිෂ්‍යයන් යොමු කරන්න.
- අභිකුණ්ඨික ජනතාව පිළිබඳ තොරතුරු ගවේෂණය සඳහා ශිෂ්‍යයන් කණ්ඩායම් ක්‍රියාකාරකමක නිරත කරවන්න. (මේ සඳහා ඇමුණුමෙහි සඳහන් අත් පත්‍රිකාව සහ එම ජනතාව පිළිබඳ ලියැවුණු පොත්පත් හා ලිපි ලේඛන යොදා ගන්න.)
- තොරතුරු ගවේෂණය පහත සඳහන් ශීර්ෂ යටතේ සිදු කරන්න.
  - අභිකුණ්ඨික ජනතාවගේ ඉතිහාසය
  - අභිකුණ්ඨික ජනතාවගේ ජීවන චර්යාව
  - ජීවන වෘත්තීන්
  - අභිකුණ්ඨික ජනතාවගේ භාෂාව

**ඇගයීම හා තක්සේරුකරණය :**

- අභිකුණ්ඨික ජනතාව පිළිබඳ ව ලියැවුණු ලිපි ලේඛන පරිශීලනය කරයි.
- අභිකුණ්ඨික ජනතාවගේ සිරිත් විරිත් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අභිකුණ්ඨික ජනතාව පිළිබඳ තොරතුරු රැස් කර ඉදිරිපත් කරයි.
- විවිධ ජන කොටස් සමග සහජීවනයෙන් කටයුතු කරයි.

ඇමුණුම 1

## ශ්‍රී ලංකාවේ අහිකුණ්ඨික ජනතාව

ශ්‍රී ලංකාවේ ජීවත් වන විවිධ ජන කොටස් අතුරින් සුවිශේෂ චාරිත්‍ර - වාරිත්‍ර ගති ලක්ෂණ පෙන්නුම් කරන ජන කොටසක් ලෙස අහිකුණ්ඨික ජනතාව හඳුන්වා දිය හැකි ය. 'අහිකුණ්ඨික' යන වචනයෙහි අර්ථය සලකා බලන විට 'අහි' යන්නෙන් සර්පයා ද 'කුණ්ඨික' යන්නෙන් නැටවීම, ක්‍රීඩා කරවීම යන අර්ථ ලැබෙන බව පෙනී යයි. ඒ අනුව 'අහිකුණ්ඨික' යන වචනය 'නයි නටවන්නා' යන අර්ථවත් පදයකි.

අහිකුණ්ඨික ජනතාව සංචාරක ජීවිතයක් ගත කරන ජන කොට්ඨාසයකි. ඔව්හු ගමින් ගමට යමින් නාගයින් හා රිළවුන් නටවමින් ද ශාස්ත්‍ර කියමින් ද ජීවිකාව කරති. මොව්හු තාවකාලික වාසස්ථාන තනා ගෙන ජීවත් වෙති. එක් ගමක දින හතකට වඩා රැඳෙන්නේ නැත. සැතපුම් දහයක් පමණ දුරින් තවත් තැනෙක වාසස්ථාන තනා ගෙන තවත් දින හතක් ඒ ප්‍රදේශයේ වාසය කරති. මෙලෙස ඔව්හු රට පුරා සංචාරය කරමින් දිවි ගෙවති. කණ්ඩායම් දෙකක් එක ම ගමක වාසය කරන්නේ ද නැත. වසරකට වතාවක් ලංකාවේ වාසය කරන සියලු ම අහිගුණ්ඨික මිනිස්සු එක තැනකට රැස් වෙති. රැස් වී කණ්ඩායම් අතර ආවාහ විවාහ කටයුතු ද ණය ගනුදෙනු ආදිය ද සිදු කර ගනිති. ඊ ළඟ අවුරුද්දේ කරන වැඩ කටයුතු හා සංචාරය කරන ප්‍රදේශ පිළිබඳ තීරණය කරන්නේ ද මෙම මහා සම්මේලනයේ දී ය.

එක ගමක දින හතක කාලයකට වඩා වාසය නො කරන්නේ එ ගම අපවිත්‍ර වීම වැළැක්වීමට ය. ගමක වාසය කිරීමට පෙර ඒ ගම් වැසියන්ගෙන් අවසර ගැනීමක් සිදු කරනු ලැබේ. අහිකුණ්ඨික මිනිසුන්ට වාසස්ථාන තනා ගැනීමට බිමක් ලබා දීමට ගම් වැසියෝ අකමැති නො වෙති. ඔවුන්ට ඉඩම් සින්න වීමක් නො වන බව ගම් වැසියන් දන්නා හෙයිනි. බොහෝ විට අහිකුණ්ඨික ජනයා තම වාසය සඳහා කනත්තක් හෝ පාළු බිමක් තෝරා ගනිති. ඊට හේතුව තම වර්ගයාගේ රහස් ආරක්ෂා කිරීමට බව ඔව්හු පවසති.

අහිකුණ්ඨික ජනතා කණ්ඩායම් වශයෙන් ජීවත් වන බව ඉහත සඳහන් විය. මෙම එක් කණ්ඩායමකට පවුල් දෙකත් පහළොවත් අතර ප්‍රමාණයක් අයත් වේ. කණ්ඩායම් නායකයා ආරච්චි හෙවත් ' පෙරිය මනුෂ්‍යයම් ' (ප්‍රධාන මිනිහා) නමින් හැඳින් වේ. කණ්ඩායම් නායකයා තෝරා ගනු ලබන්නේ කණ්ඩායමේ සියලු දෙනාගේ ම කැමැත්තෙනි. ඔහු ක්ෂේත්‍රයේ සියලු නීති රීති මනාව දත්, වයස අවුරුදු 30 ඉක්ම වූ අපක්ෂපාතී ව තීරණ ගන්නා පුද්ගයෙකු විය යුතු ය. නායකයාගේ තීරණයට අවනත වීම කණ්ඩායමේ සියලු දෙනාගේ ම වගකීමකි. කණ්ඩායමේ නායකයා නඩු හබවල දී අධිකරණ තීරකයා ලෙස ද කටයුතු කරයි. කණ්ඩායම් කිහිපයකට ද නායකයෙක් සිටියි. ඔහු ' කෝරල මාමා ' නමින් හැඳින්වෙයි.

ශ්‍රී ලංකාවේ අහිකුණ්ඨික ජනතාවට දිගු ඉතිහාසයක් ඇත. ඔව්හු ඉන්දියාවේ සිට මෙරටට සංක්‍රමණය වූ ජන කොට්ඨාසයක් ලෙස පිළිගැනේ. ඉතිහාසයේ කුමන වකවනුවක දී ලංකාවට පැමිණියේ දැයි ස්ථිර ව කිව නො හැකි වුවත් ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍රය රැසක මොවුන් පිළිබඳ සඳහන් වේ. සද්ධර්ම රත්නාවලියේ 'අහිකුණ්ඨික වත්ථු' නමින් පුවතක් ඇතුළත් වීම, පන්සිය පනස් ජාතක පොතේ

'භූරිදත්ත' හා 'චම්පෙය්‍ය' ජාතක කතාවල නයි නැටවීමෙන් ජීවත් වූ අහිකුණ්ඨිකයකු පිළිබඳ සඳහන් වීම නිදසුන් ලෙස දැක්විය හැකි ය. සොකරි නාට්‍යයෙහි ද ඉන්දියාවේ සිට පැමිණි අහිකුණ්ඨිකයකු පිළිබඳ සඳහන් වේ. මේ කරුණු ඇසුරෙන් පෙනී යන්නේ අහිකුණ්ඨික ජනතාව බොහෝ කලක සිට මෙරට ජීවත් වන බව ය.

අහිකුණ්ඨික ජනයෝ ස්වභාව ධර්මය දේවත්වයෙන් සලකා වැඳුම් පිදුම් කරති. එහෙත් ඇතැම් අහිකුණ්ඨිකයින් පවසන්නේ තමන් බෞද්ධයන් බව යි. එහෙත් ඔවුන බෞද්ධ වත් පිළිවෙත් අනුගමනය කරන බවක් නොපෙනේ. පන්සල, පල්ලිය, කෝවිල, වෙනසක් නොමැති ව සෑම සිද්ධස්ථානයකට ම වැඳුම් පිදුම් සඳහා යන බව පෙනේ. අහිකුණ්ඨික ජනයෝ හින්දූන් මෙන් සිකුරාදා දිනය ශුද්ධ දිනයක් ලෙස සලකති. එසේ ම විෂ්ණු හා කතරගම වැනි දෙවිවරුන් අදහති. ගව මස් කන මුස්ලිම් ගෙවල්වලට පවා නො යති. එහෙත් බෞද්ධ බෝධිසත්වයන් සහ අහිකුණ්ඨිකයන් අතර සම්බන්ධය ඔව්හු ආඩම්බරයෙන් ප්‍රකාශ කරති.

අහිකුණ්ඨික ජනයෝ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් විශ්වාස කරති. යන්ත්‍ර මන්ත්‍ර හා ගුරුකම් කිලිදෝෂ මගින් විනාශ වීම හෝ බල රහිත වීම සිදු වන බව ඔව්හු විශ්වාස කරති. ඔව්හු කූඩාරමක් ඉදිකළ විගස ම ඒ වටා මැතිරූ ගල් වළලති. බාගෙට පිළිස්සුණු රෙදි පාංකඩ අදිති. මේ මගින් කිලි දෝෂවලින් දුරු වීමට මෙන් ම සර්පයන්, වන සතුන් සහ අවට ගම්වල බල්ලන්ගෙන් ආරක්ෂා වීමට හැකි බව විශ්වාස කරති.

නාගයා අහිකුණ්ඨිකයන්ගේ සංකේතය යි. ඔවුන් ජීවත් වන ගෙපැල හඳුන්වන්නේ නා ඉල්ල (නාග ගෘහය) ලෙස යි. අහිකුණ්ඨිකයෝ තමන් සහ නාගයා අතර ඇති සම්බන්ධය ඉතා ගෞරවයෙන් සලකති. අහිකුණ්ඨික පිරිමි නයි නටවති. ගැහැනු ශාස්ත්‍ර කියති. පිරිමි නයි නටවන්නේ නළා පිඹිමිනි. නයි නැටවීමට අමතර ව රිළවුන් නැටවීම ද කරති. නයි නැටවීමෙන් ත්‍රාසයත්, රිළා නැටවීමෙන් විනෝදයත් ගෙන දෙයි. රිළා රඟපෑම් අතර සිංහල රජකාලේ අපරාධකාරයෙකු උලේ ඉන්දවා සිටින සැටි, හොරා පොල් කඩන හැටි, තොටුපළේ දී කෙල්ලට යකා වැහුණ හැටි, තැගි අරන් නැන්ද මාමා බලන්න යන හැටි ආදි සෙල්ලම් ජනතාවට විනෝදය ගෙන දීමට සමත් වේ.අහිකුණ්ඨිකයෝ නයි ඇල්ලීමට ද, නයි දෂ්ට කළ විට බෙහෙත් කිරීමට ද දක්ෂ වෙති. ඔවුන් අත නයි ගල් ඇත. නයි ගල් මගින් සර්ප විෂ ඇද්දීම කළ හැකි බවට විශ්වාස කරති.

වර්තමානයේ අහිකුණ්ඨික ජනතාව වෙනුවෙන් වෙන ම ගම්මානයක් ඉදි කර ඇත. ඒ අනුරාධපුර ප්‍රදේශයේ ' කුඩාගම ' නම් ප්‍රදේශය යි. එහෙත් සංචාරක අහිකුණ්ඨිකයෝ තවමත් දුලබ නො වෙති.

**අහිකුණ්ඨික භාෂාවේ වචන කිහිපයක්**

| | | | | | |
|---|---|---|---|---|---|
| මස්කන් | - | පිහිය | රෝලු | - | වංගෙඩිය |
| තාලේ | - | බේසම | ඉරමින් | - | හිරමණය |
| සක් | - | කුල්ල | | | |
| කඳව | - | වතුර කලය | | | |
| පී පෙට්ටිය | - | නයි පෙට්ටිය | | | |

අභිකුණ්ඨික භාෂාවේ ඥාති නාම

| | | |
|---|---|---|
| අබ්බඩා | - | පියා |
| මාමා | - | මව |
| අට්ටම්මා | - | නැන්දා |
| පෙඩම්මා | - | ලොකු අම්මා |
| අන්නා | - | අය්යා |
| තාතා | - | ආතා |
| මුල්ලම්මා | - | ආච්චි |

## 10. නාම පද (උක්ත - අනුක්ත භේදය)

**නිපුණතාව** : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 6.1 නාම පද හා එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- උක්ත නාම පද හා අනුක්ත නාම පද නිදසුන් සහිත ව ඉදිරිපත් කරයි.
- ලේඛනයේ දී උක්ත හා අනුක්ත නාම පද නිවැරදි ව යෙදිය යුතු බව පිළිගනියි.
- උක්ත හා අනුක්ත භේදය අනුව නාම පද නිවැරදි ව වාක්‍යවල යොදයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

පහත සඳහන් ආකාරයේ නිදර්ශන වාක්‍ය කිහිපයක් ප්‍රදර්ශන කරන්න.

1. **දෙමව්පියෝ** දරුවන් රකිති.
2. අපි **දෙමව්පියන්** නමදිමු.
1. **මිනිස්සු** ගස් වවති
2. සත්තු **මිනිසුන්** දැක පලා ගියහ.
1. **ළමයි** මල් කඩති
2. **ළමයින්** කැඩූ මල් පරවිය.
1. **වලසෙක්** මිනිසාට කඩා පැන්නේ ය.
2. අපි **වලසකු** දැක බියට පත්වීමු.

- මුල් වාක්‍ය යුගලයෙහි පළමු වන වාක්‍යයේ 'දෙමව්පියෝ' යන්න අවසාන ක්‍රියාවෙන් කියැවෙන නාම පදය යි. 'රකිති' යන අවසාන ක්‍රියාවෙන් දෙමව්පියෝ යන්න ප්‍රකාශ වේ. ඒ නිසා එක් උක්ත පදය ලෙස ව්‍යවහාර වන බව පවසන්න.
- එහි දෙවන වාක්‍යයේ 'දෙමව්පියන්' යන්න අවසාන ක්‍රියාවට යටත් වන කර්ම පදය යි. ඒ නිසා එය අනුක්ත පදය බව පැහැදිලි කර දෙන්න.
- උක්ත පදය 'දෙමව්පියෝ' බවත්, අනුක්ත පදය 'දෙමාපියන්' වන බවත් පැහැදිලි කරන්න.
- ඉතිරි වාක්‍ය යුගලවල ද ඒ ආකාරයට ම උක්ත, අනුක්ත පද යෙදී සිටින ආකාරය පැහැදිලි කරන්න.
- ළමයින් කණ්ඩායම් දෙකකට වෙන් කර එක් කණ්ඩායමක් උක්ත පදය පවසන විට අනෙක් කණ්ඩායම අනුක්ත පදය පැවසීමට අවස්ථාව ලබා දෙන්න. මේ සඳහා ඇමුණුම 1හි වචන යොදා ගත හැකි ය.
- ඇමුණුම 2හි සඳහන් ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.
- ආඛ්‍යාතයට අනුව උක්තය යෙදෙන ආකාරය පැහැදිලි කරන්න. ඇමුණුම 3හි සඳහන් අභ්‍යාස ලබා දෙන්න.
- පෙළපොතේ අභ්‍යාසවලට ද යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නාම පදයක උක්ත රූපය හා අනුක්ත රූපය අතර වෙනස හඳුනා ගෙන ප්‍රකාශ කරයි.

- වාක්‍යයක උක්ත හා අනුක්ත පද හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ආඛ්‍යාතයට උචිත පරිදි උක්ත පද හා අනුක්ත පද නිවැරදි ව යොදා වාක්‍ය ලියයි.
- උක්ත - අනුක්ත භේදය හඳුනා ගෙන වාක්‍ය නිවැරදි කරයි.

**ඇමුණුම අංක 01**

| <u>උක්ත පද</u> | <u>අනුක්ත පද</u> | [illegible] | [illegible] |
|---|---|---|---|
| මිනිස්සු | මිනිසුන් | දරුවෙක් | දරුවෙකු |
| ගුරුවරු | ගුරුවරුන් | දැරියක් | දැරියක |
| බල්ලෙක් | බල්ලෙකු | ළමයෙක් | ළමයකු |
| සිංහයෝ | සිංහයන් | නිළියක් | නිළියක |
| ගැමියෝ | ගැමියන් | මම | මා |
| වැද්දෝ | වැද්දන් | අපි | අප |
| රිළවු | රිළවුන් | තෝ | තා |
| සොරු | සොරුන් | තොපි | තොප |
| බළල්ලු | බළලුන් | ඕ, ඕතොමෝ | ඇ, ඇය |
| මොනරු | මොනරුන් | හේ, හෙතෙම | ඔහු |
| වලස්සු | වලසුන් | ඔවුහු | ඔවුන් |
| කුමාරයෝ | කුමාරයන් | | |

**ඇමුණුම අංක 02**

| උක්ත පද | අනුක්ත පද |
|---|---|
| බල්ලෝ | ................................ |
| .................................... | කුරුල්ලන් |
| නිළියක් | ................................ |
| ගොන්නු | ................................ |
| කම්කරුවෝ | ................................ |
| .................................... | කලාකරුවන් |

**ඇමුණුම අංක 03**

**වාක්‍ය නිවැරදි කර ලියන්න.**

01. දෙමව්පියන් ළමයින් ආරක්ෂා කරති.
02. අප දිනපතා පුවත්පත් කියවමු.
03. කුඩා දරුවෙකු වීර ක්‍රියාවක් කරයි.
04. මා ඊට සම්බන්ධ නො වෙමි.
05. නා හිමියන් දහම් දෙසති.
06. අලුයම කුකුළන් හඬලති
07. හිරු නැගෙන විට මොනරුන් පිල් විදහා නටති.
08. ගුරුවරුන් අපට හොඳ නරක කියා දෙති.
09. ගොවියන් ශ්‍රී ලංකාව සහලින් පෝෂණය කරති.
10. ගුරුවරුන් පාසලේ සිටිති.

**උක්ත පද හා අනුක්ත පද නිවැරදි ව තෝරා යටින් ඉරක් අඳින්න.**

1. (මිතුරෙක්/මිතුරෙකු) සිද්ධිය විස්තර කරයි.
2. අපි (කම්කරුවන්/කම්කරුවෝ) වැඩ කරන තැනට ගියෙමු.
3. දුටුගැමුණු රජතුමා (යෝධයෝ/යෝධයන්) සමග සටනට පිවිසියේ ය.
4. (වෛද්‍යවරු, වෛද්‍යවරු) ලෙඩුන් පරීක්ෂා කරති.
5. මම අසරණ (සතෙක්/සතෙකු) බේරා ගතිමි.

# 11. මේ කාගේ දෝ කමතා (ජනකවි)

**නිපුණතාව** : 11.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 11.1 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- ජනකවිවල ස්වභාවය හඳුනා ගෙන විස්තර කරයි.
- ජනකවිවලින් ප්‍රකට වන මානව අත්දැකීම් ඉස්මතු කර දක්වයි.
- ජනකවි රසාස්වාදයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ජනකවියේ ස්වභාවය හා පසුබිම පාඩම ඇසුරින් උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න.
- ජනකවි පෙළට සවන් දීමට හා ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කවි පෙළෙහි අර්ථය පැහැදිලි කරන්න.
- ගොවි ජීවිතයේ එක් අවස්ථාවක් වූ කොළ මැඩීම මෙමගින් නිරූපණය වන බව පහදා දෙන්න.
- කොළ මැඩීමේ අවස්ථාවට අදාළ අත්දැකීම් සාකච්ඡා කරන්න.
  - කොළ මැඩීම සඳහා ගොනා ගෙන ඒම
  - බැත එක් රැස් කිරීම
  - බුදුන් සිහි කිරීම
  - කිරි ඉතිරවීම
- කොළ මැඩීමේ දී භාවිත කරන භාෂාව පාඩම ඇසුරින් උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න.
- කවි පෙළ රස වින්දනය සඳහා මග පෙන්වන්න.
  - තාලයට ගායනා කිරීමට හැකි වීම.
  - සරල ගැමි වදන් ඇතුළත් වීම
  - එළිසමය නිසා රසවත් වී ඇති ආකාරය
- කවි පෙළ රසවත් වීමට බලපා ඇති හේතු මොනවා දැයි ලිවීමට අවස්ථාව ලබා දෙන්න.

**මූලික වදන්/ සංකල්ප :**

- කොළ මැඩීම - ගොයම් පෑගීම
- කමත - ගොයම් පාගන ස්ථානය
- අටු - කොටු - බැත (වී) තැන්පත් කර ඇති ස්ථානය

**ගුණාත්මක යෙදවුම් :**

- සිංහල ජනකවි සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ජනකවි I - ජාතික අධ්‍යාපන ආයතනය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කමත් බසෙහි යෙදෙන වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ජනකවියේ ස්වභාවය පැහැදිලි කරයි.
- තාලානුකූල ව ජන කවි ගායනා කරයි.
- ජනකවිවල අදහස නිවැරදි ව ඉදිරිපත් කරයි.
- ජනකවි පිළිබඳ රසාස්වාදයක් ලියයි.

## 12. විරුද්ධාර්ථ පද

**නිපුණතාව** : **5.0** භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල** :

- විරුද්ධාර්ථ පද හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- විරුද්ධාර්ථ පදවල ස්වභාවය විස්තර කරයි.
- ලේඛනයේ දී විරුද්ධාර්ථ පද අර්ථවත් ව භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- නිදසුන් ඇසුරින් විරුද්ධාර්ථ පද හඳුන්වා දෙන්න.

- උදා : හොඳ - නරක
  හිමි - අහිමි
  දුක - සැප
  පින් - පව්

- විරුද්ධාර්ථ පද සෑදෙන විවිධ ආකාර පැහැදිලි කරන්න.
  - මුලින් උපසර්ගයක් යෙදීමෙන් උදා : භය - නිර්භය
  - මුලින් නිපාතයක් යෙදීමෙන් උදා: හොඳ - නොහොඳ
  - වෙනත් පදයක් භාවිත කිරීමෙන් උදා: අඳුර - එළිය

- විරුද්ධාර්ථ පද ලිවීම සඳහා ජනකවි පාඩමෙන් තෝරා ගත් පද කිහිපයක් ශිෂ්‍යයන්ට ලබා දෙන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමක් පදයක් කියූ විට අනෙක් කණ්ඩායම එහි විරුද්ධාර්ථ පැවසීමේ ක්‍රියාකාරකමක් මෙහෙවන්න.
- ඇමුණුම 1හි සඳහන් අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- විරුද්ධාර්ථ පද සහිත වචන මාලාවක්
- විරුද්ධාර්ථ ශබ්දකෝෂය - ඩබ්. එස්. කරුණාතිලක
- විරුද්ධාර්ථ වාක්කෝෂය - තිස්ස ඊරියගම

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සිංහල භාෂාවේ භාවිත වන පද වර්ග නම් කරයි.
- විරුද්ධාර්ථ පද පැහැදිලි කරයි.
- විරුද්ධාර්ථ පදවලට නිදසුන් ඉදිරිපත් කරයි.
- පාඩමෙන් තෝරා ගත් පදවලට විරුද්ධාර්ථ පද ලියයි.

අමුණුම 1

- පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද පාඩමෙන් සොයා ලියන්න.

ඉර, ඉහළ, දුටු, යට, නරක
අවේලාව, කළ

- පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.

ළඟ -
ඈත -
උත්තම -
එනවා -
උඩ -

- විරුද්ධාර්ථය දෙන පදය කොටුවෙන් සොයා ලියන්න.

ප්‍රශ්නය -
කඩිසර -
අග -
පැහැදිලි -
ආවරණය -

| |
|---|
| අපැහැදිලි |
| පිළිතුර |
| කම්මැලි |
| අනාවරණය |
| මුල |

- යටින් ඉරි ඇදි පදවලට විරුද්ධාර්ථ පද තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. උදේ පිපුණු මල සවසට .......................
2. දක්ෂ මෙන් ම ..................... ළමයි ද පන්තියේ සිටිති.
3. පොළව නිසරු වුව ද පොහොර යොදා ....................... අස්වැන්නක් ලබා ගත හැකි ය.
4. රෝගී වූ අය .................... කිරීමට ඖෂධ ලබා දෙයි.
5. ඉහළට පැද ගිය ඔරුව සැඩ පහර නිසා .................... ඇදී ගියේ ය.

## 13. එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා

**නිපුණතාව** : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 9.5 විවිධ නායකයන්ගේ චරිත කතා පරිශීලනය කරයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමාගේ චරිත කතාව කියවයි.
- එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමාගේ ජීවන තොරතුරු ඉදිරිපත් කරයි.
- එඩ්මන් පීරිස් රදගුරුතුමාගෙන් සමාජයට සිදු වූ සේවය අගය කරයි.
- එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පාඩම කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ශිෂ්‍යයන් සමග එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා හා එතුමාගේ ජීවන චරිතය පිළිබඳ සාකච්ඡා කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් තුනකට බෙදා පහත මාතෘකා යටතේ තොරතුරු රැස් කිරීමට පවරන්න.
    1. ජීවන තොරතුරු
    2. සමාජ සේවය
    3. ලබා ගත හැකි ආදර්ශ
- එක් එක් කණ්ඩායම් රැස් කර ගත් තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කිරීම්වලින් මතු වූ කරුණු සමාලෝචනයක යෙදෙන්න.
- පෙළපොතේ අභ්‍යාසවලට යොමු කරන්න.

**මූලික වදන්/ සංකල්ප :**

- අගරදගුරු - කිසියම් රටක හෝ රදගුරු පදවි (කතෝලික සභාවේ ආගමික බල ප්‍රදේශ) කිහිපයක හෝ ප්‍රධාන පූජකතුමා (නායකයා).

**ගුණාත්මක යෙදවුම් :**

- එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා පිළිබඳ ලියූ ලිපි
- ඡායාරූප

**ඇගයීම හා තක්සේරුකරණය :**

- එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමාගේ ජීවන තොරතුරු ලැයිස්තු ගත කරයි.
- එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමාගෙන් සමාජයට සිදු වූ සේවය අගය කරයි.
- එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ ලියයි.
- පාඩමේ ඇතුළත් දුරවබෝධ වචන අර්ථ දක්වයි.

## 14. ක්‍රියා පද (පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා)

**නිපුණතාව** : **6.0** සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 6.2 ක්‍රියා පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- ක්‍රියා පද වර්ග කර දක්වයි.
- පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා අතර වෙනස පැහැදිලි කරයි.
- ලේඛනයේ දී මිශ්‍ර ක්‍රියා පද නිවැරදි ව භාවිත කරයි.
- ලේඛනයේ දී පූර්ව ක්‍රියා පද නිවැරදි ව භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- 'ක්‍රියා පද' යනු කුමක් ද යන්න ශිෂ්‍යයන් සමග සාකච්ඡා කර එය නිදසුන් කිහිපයක් ඇසුරෙන් තහවුරු කරන්න.
  (කිරීමක්, වීමක්, විඳීමක් ප්‍රකාශ කරන පද ක්‍රියා පද බව)

  උදා : ළමයා අකුරු <u>ලියයි</u> (කිරීමක්)
  අහසේ තරු <u>*බැබළෙයි.*</u> (වීමක්)
  මම පරිසරයේ සුන්දරත්වය <u>විඳිමි.</u> (විඳීමක්)
- ක්‍රියා පදවල විවිධ ප්‍රභේද සාකච්ඡා කර එහි මූලික බෙදීම් 2ක් ඇති බව පෙන්වා දෙන්න.
  1. අවසාන ක්‍රියා
  2. අනවසාන ක්‍රියා
- වාක්‍යයක ආඛ්‍යාතය ලෙස යෙදෙන්නේ අවසාන ක්‍රියා බව නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.
  ළමයා සෙල්ලම් <u>කරයි.</u>
  මව දරුවන්ට ඔවදන් <u>දුන්නා ය.</u>
  ගොවියෝ කුඹුරු <u>කොටති.</u>
- වාක්‍යයක ආඛ්‍යාතය ලෙස නො යෙදෙන ක්‍රියා පද අනවසාන ක්‍රියා බව නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.
  ළමයි <u>දුවමින්</u> සෙල්ලම් කරති.
  අම්මා නැළවිලි ගීයක් <u>ගයා</u> දරුවන් නැළෙව්වා ය.
- අනවසාන ක්‍රියා වර්ගයට අයත් ක්‍රියා පද ලෙස පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා හඳුන්වා දෙන්න.
- අවසාන ක්‍රියාව සමග තවත් ක්‍රියාවක් සිදු වේ නම් ඒවා මිශ්‍ර ක්‍රියා බව නිදසුන් ඇසුරින් පෙන්වා දෙන්න.
  උදා : දැරිය ගීයක් <u>ගයමින්</u> නැටුවා ය.
  මල්ලී ක්‍රීඩා තරඟය <u>නරඹමින්</u> අත්පොළසන් දුන්නේ ය.
- අවසාන ක්‍රියාවට පෙර සිදු වූ හෝ කරන ලද ක්‍රියා පූර්ව ක්‍රියා බව නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.
  අම්මා බත් <u>උයා,</u> දරුවන්ට කැව්වා ය.
  මල්ලි දත් <u>මැද,</u> මුව <u>දොවා,</u> හිස පීරුවේ ය.

- එක ම පූර්ව ක්‍රියා පදය දෙවරක් යෙදීමෙන් (ද්විත්ව වීමෙන්) මිශ්‍ර ක්‍රියා සකසා ගත හැකි බව නිදසුන් මගින් සාකච්ඡා කරන්න.

  උදා : තාත්තා දර කප කපා ගොඩ ගැසුවේ ය.
  දැරිය ගීතය ගය ගයා නැටුවා ය.
- දී ඇති වගුව ඇසුරෙන් පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා අතර වෙනස ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න. එය තහවුරු කිරීමට උචිත අභ්‍යාස ලබා දෙන්න.

| ක්‍රියා පද | පූර්ව ක්‍රියා පදය | මිශ්‍ර ක්‍රියා පදය |
|---|---|---|
| නටයි | නටා | නටමින්/නට නටා |
| හඬයි | හඬා | හඬමින්/හඬ හඬා |
| ලියයි | ලියා | ලියමින්/ලිය ලියා |
| කපයි | කපා | කපමින්/කප කපා |

- ඇමුණුම 1හි සඳහන් අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- පූර්ව ක්‍රියා පද හා මිශ්‍ර ක්‍රියා පද ලියා සකසා ගත් පුවරු

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ක්‍රියා පදයක් යනු කුමක් දැයි හඳුන්වයි.
- පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා නිවැරදි ව වෙන් කර දක්වයි.
- ක්‍රියා පදවලට අනුරූප පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා සකස් කරයි.
- පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා අතර වෙනස හඳුනා ගෙන වාක්‍යවල නිවැරදි ව යොදයි.

ඇමුණුම 1

- පාඩමෙහි සඳහන් පූර්ව ක්‍රියා සහ මිශ්‍ර ක්‍රියා පද සොයා ලැයිස්තු ගත කරන්න.
- හිස්තැනට සුදුසු පූර්ව ක්‍රියා රූපය හෝ මිශ්‍ර ක්‍රියා රූපය හෝ යොදන්න.

1. නැන්දා රෙදි .......................... (සෝදයි) වැලෙහි වැනුවා ය.
2. ගුරුවරු අවවාද ...................... (දෙයි) සිසුන් යහමඟ යවති.
3. මම බසයෙන් ............................ (බසියි) නිවසට ගියෙමි.
4. අක්කා පොත ........................... (කියවයි) පාඩම පැහැදිලි කළා ය.
5. අම්මා දර ...................... (කඩයි) මිටි .............................. (බඳියි) හිස මත තබා ගත්තා ය.

- පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා පද යොදා වාක්‍ය 05ක් නිර්මාණය කරන්න.

## 15. කතාබහට සංයමයක් (සුහද සංවාද)

**නිපුණතාව** : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 1.2 සවන් දී ප්‍රතිචාර දැක්වීමේ දී ආචාරශීලී බව හා සංයමය ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- පුද්ගල විවධත්වය අනුව භාෂාව භාවිත කරයි.
- පුද්ගල විවිධත්වය හා අවස්ථාව අනුව ප්‍රතිචාර දක්වයි.
- සංයමයෙන් යුක්ත ව සවන් දී ප්‍රතිචාර දක්වයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පෙළපොතේ සඳහන් සුහද සංවාදය සුදුසු ක්‍රමවේදයක් මගින් ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න. ඒ ඇසුරෙන් පුද්ගල විවිධත්වයට ගැළපෙන ලෙස කතා බහ හා සවන් දීම කළ යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා කරන්න. මේ සඳහා පහත සඳහන් ආකාරයේ පුද්ගල විවිධතා හා අවස්ථා යොදා ගත හැකි ය.
  1. භික්ෂූන් වහන්සේ/පූජකතුමන් සමග කතා බහ
  2. ගුරුවරුන් සමග කතා බහ.
  3. වැඩිහිටියන් සමග කතා බහ.
  4. රජයේ/පුද්ගලික කාර්යාලයක නිලධාරීන් සමග කතා බහ.
- සවන් දීමේ දී හා ප්‍රතිචාර දැක්වීමේ දී පැවතිය යුතු ආචාරශීලී බව හා සංයමය පිළිබඳ සාකච්ඡා කරන්න.
  - අවස්ථාවට උචිත ස්වරයක් (හඬක්) භාවිත කිරීම.
  - අවස්ථාවට හා පුද්ගලයින් ගැළපෙන වචන භාවිතය
  - උචිත අංග චලන භාවිතය
  - සංවර බව
  - සවන් දුන් පසු ප්‍රතිචාර දැක්වීම
  - කතාවට බාධා නො කිරීම
- පන්තිය කණ්ඩායම්වලට බෙදා පහත සඳහන් තේමා ඇසුරු කර ගෙන පුද්ගල දෙපිරිසක් අතර සිදු වන කතා බහක් නිර්මාණාත්මක භූමිකා රංගනයකින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  1. භික්ෂූන් වහන්සේ/පූජකතුමන් සමග ශ්‍රාවකයින් කරන කතාබහ.
  2. ගුරු පිරිස් සමග සිසු පිරිසක් කරන සංවාද
  3. වැඩිහිටියන් සමග බාලයින් කරන කතා බහක්.
  4. රජයේ/පුද්ගලික කාර්යාලයක නිලධාරීන් සමග සේවාලාභියා කරන කතා බහක්.
- මෙහි දී ඒ ඒ පුද්ගලයන්ට හා අවස්ථාවන්ට උචිත ලෙස සවන්දීම හා කතාබහ සිදු විය යුතු බවට උපදෙස් දෙන්න.
- භූමිකා රංගනය සඳහා සූදානම් වීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- භූමිකා රංගනය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සංයමයෙන් හා ආචාරශිලී බවින් යුක්ත ව ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය ප්‍රකාශ කරයි.
- ආචාරශීලී ව හා සංයමයෙන් යුක්ත ව සවන් දෙයි.
- ආචාරශීලී ව හා සංයමයෙන් යුක්ත ව ප්‍රතිචාර දක්වයි.
- කණ්ඩායමේ ක්‍රියාකාරකම්වල නිර්මාණාත්මක ව හා සුහදශීලී ව නිරත වෙයි.

## 16. තිලමුට්ඨි ජාතකය

**නිපුණතාව** : 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.2 විවිධ ශෛලියෙන් රචිත පොත පත කියවයි

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- ශ්‍රාවකයන්ගේ අවධානය යොමු වන පරිදි කියවයි.
- ජාතක කතාවක ස්වභාවය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- තිලමුට්ඨි ජාතකයේ කතා සාරය ඉදිරිපත් කරයි.
- තිලමුට්ඨි ජාතකයෙන් ගත හැකි ජීවිතාදර්ශ ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- සුදුසු ක්‍රමවේදයක් යොදා ගනිමින් තිලමුට්ඨි ජාතකය ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- පුරාතන සාහිත්‍ය ග්‍රන්ථ කියවීමේ දී ශ්‍රැති ගෝචර ශෛලියෙන් කියවිය හැකි බව උදාරහරණ කිහිපයක් මගින් පෙන්වා දෙන්න.
  (සද්ධර්ම රත්නාවලිය, බුත්සරණ, වැනි ග්‍රන්ථවලින් උපුටා ගත් කොටස්)
- ජාතක කතා කියවීම සඳහා ද එවැනි ශෛලියක් ඇති බව ශිෂ්‍යයන්ට අවබෝධ කර දෙන්න.
- තිලමුට්ඨි ජාතකය කියවීමට සෑම ශිෂ්‍යයෙකුට ම අවස්ථාව ලබා දෙන්න.
  උච්චාරණය, හඬපාලනය, විරාම ලකුණු අනුගමනය කිරීම පිළිබඳ මෙහි දී අවධානය යොමු කරන්න.
- තිලමුට්ඨි ජාතකයේ කතා සාරය ඉදිරිපත් කරන්න.
  - ශිල්ප හැදෑරීමට දිසාපාමොක් ළඟට යාම
  - තල කෑම
  - දඬුවම් දීම
  - වෛර බැඳීම
  - ශිල්ප හදාරා පිටව යාම
  - දිසාපාමොක් කැඳවීම
- ජාතක කතාවක ලක්ෂණ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
  - වර්තමාන කතාව
  - අතීත කතාව
  - පූර්වාපර සන්ධි ගැළපීම
- සෑම ජාතක කතාවක ම මේ ලක්ෂණය දක්නට ලැබෙන බව උදාරණ සහිත ව පෙන්වා දෙන්න.
- ජාතක කතාවෙන් ගත හැකි ආදර්ශ පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න
  - කළ වරද අවබෝධ කර දීම.
  - ශිල්ප ශාස්ත්‍ර නො අඩුව ලබා දීම
  - ගුරුවරයාගේ අනුශාසන පිළිගැනීම
  - ගුරුවරයාට බොහෝ සම්පත් ලබා දීම
  - ගුරුවරයාට කෘතවේදී වීම
- එදා සහ අද අධ්‍යාපන ක්‍රමයේ වෙනස්කම් පාඩම ඇසුරින් සොයා, 'ද්විත්ව සටහන් ජර්නලයක්' සකස් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න.

**මූලික වදන්/ සංකල්ප :**

| | | |
|---|---|---|
| • මස්සෙන් | - | රන් කාසිවලින් |
| • පිළි සඟලක් | - | රෙදි යුගලක් |
| • ආචාරිභාගය | - | ගුරුවරයාට දෙන ගුරු පඬුර |
| • නකත් සලස්වා | - | සුබ නැකතින් |
| • අන්‍යායවක් | - | නීතියට විරුද්ධ |
| • ඉනිබ්බෙ | - | ඊට පසුව |
| • පාටව කෙරෙමි | - | දඬුවම් කරමි |
| • සමාධි ව | - | සතුටට පත් ව |
| • තරම් පදම් සලස්වා | - | සුදුසු තත්වයේ දී |

**ගුණාත්මක යෙදවුම් :**

- ජාතක කතා කිහිපයක කොටසක්
- සද්ධර්ම රත්නාවලියේ කතාවක්
- බුත්සරණ කතාවක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ශ්‍රාවකයන්ගේ අවධානය යොමු වන පරිදි තිලමුට්ඨී ජාතකය කියවයි.
- ජාතක කතාවක ලක්ෂණ ප්‍රකාශ කරයි.
- තිලමුට්ඨී ජාතකයේ කතා සාරය ඉදිරිපත් කරයි.
- ජාතක කතාවෙන් ගත හැකි ආදර්ශ ලැයිස්තු ගත කරයි.
- කතාවේ ගැටමුසු වදන් සඳහා අර්ථ සපයයි.

## 17. අපේ ලෝහ තාක්ෂණයේ යටගියාව

**නිපුණතාව** : 10.0 සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 10.2 විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොතපත පරිශීලනයෙන් ලබා ගත් දැනුම භාෂා කාර්ය සඳහා යොදා ගනියි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- පැරණි ලෝහ තාක්ෂණය ගැන ලියැවුණු ලිපි ලේඛන කියවයි.
- ලංකාවේ පැරණි ලෝහ තාක්ෂණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- අතීත ශ්‍රී ලාංකිකයන්ගේ ලෝහ තාක්ෂණික දැනුම අගය කරයි.
- ලෝහ තාක්ෂණය පිළිබඳ වාක්කෝෂය අවස්ථානුකූල ව යොදා ගනියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ලංකාවේ ලෝහ තාක්ෂණයේ ඉතිහාසය පිළිබඳ ව පෙළපොතේ සඳහන් පාඩම කියවීමට සලස්වන්න.
- පාඩමේ සඳහන් කරුණු ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ලෝහ තාක්ෂණය හා සම්බන්ධ පෙළ පොතේ සඳහන් වචන හඳුනා ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ලෝහ තාක්ෂණයේ දී පැරැන්නන් භාවිත කළ උපක්‍රම ශිෂ්‍යයන්ට හඳුන්වා දෙන්න.
- ඇමුණුම 1හි සඳහන් කාර්ය පත්‍රිකාව ශිෂ්‍යයන්ට ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ලංකාවේ ලෝහ කර්මාන්තය පිළිබඳ ලියැවුණු විවිධ ලිපි-ලේඛන, පොත-පත සහ ඡායාරූප

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ශ්‍රී ලංකාවේ ලෝහ කර්මාන්තයේ ඉතිහාසය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ලෝහ කර්මාන්තය සඳහා පැරැන්නන් භාවිත කළ තාක්ෂණික උපක්‍රම විස්තර කරයි.
- ලෝහ තාක්ෂණය පිළිබඳ පාරිභාෂික වචනවල අර්ථය පැහැදිලි කරයි.
- ලෝහ තාක්ෂණය හා සම්බන්ධ වචන ඇතුළත් කරමින් වාක්‍ය නිර්මාණය කරයි.

ඇමුණුම 1

**කාර්ය පත්‍රිකාව**

- පෙළපොතේ පාඩම හොඳින් කියවන්න.
- පාඩමේ ඇතුළත් ලෝහ තාක්ෂණය හා සම්බන්ධ වචන හා ඒවායේ අර්ථ ලැයිස්තු ගත කරන්න.
- එම වචන ඇතුළත් කරමින් වාක්‍ය නිර්මාණය කරන්න.
- අතීත ශ්‍රී ලංකාවේ ලෝහ තාක්ෂණය ගැන, පොතපතින් තොරතුරු එක් රැස් කර පොත් පිංචක් සකස් කරන්න.

# 18. වාක්‍ය රීති

**නිපුණතාව** : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 6.3 සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :
- වාක්‍යයක මූලිකාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ව්‍යාකරණානුකූල ව වාක්‍ය ලිවීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- උක්තය, කර්මය හා ආඛ්‍යාතය කෙරෙහි සැලකිලිමත් වෙමින් වාක්‍ය ලියයි.
- කාල භේදය කෙරෙහි සැලකිලිමත් වෙමින් වාක්‍ය නිර්මාණය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**
- වාක්‍යයක මූලිකාංග තුනක් ඇති බව පැහැදිලි කර දෙන්න.
  1. උක්තය 2. කර්මය 3. ආඛ්‍යාතය (ක්‍රියාව)
- මේ සඳහා නිදර්ශන වාක්‍ය කිහිපයක් යොදා ගන්න.
  මිනිසා දර කපයි.
  අම්මා බත් උයයි.
  ගුරුතුමා අකුරු උගන්වයි.
- එවැනි වාක්‍ය කීපයක් නිර්මාණය කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- වාක්‍ය නිර්මාණයේ දී කාල භේදය අනුව ආඛ්‍යාතය යෙදෙන ආකාරය පැහැදිලි කරන්න.
- සිංහල භාෂාවේ අතීත අනතීත යැයි කාල දෙකක පමණක් ආඛ්‍යාතය යෙදෙන බව පහදා දෙන්න.

| අතීත | අනතීත |
|---|---|
| ළමයා ගෙදර ගියේ ය.<br>ගුරුවරු අකුරු ඉගැන්වුවෝ ය.<br>අම්මා බත් පිසුවා ය. | ළමයා ගෙදර යයි.<br>ගුරුවරු අකුරු උගන්වති.<br>අම්මා බත් පිසයි. |

- තවත් උදාහරණ ඉදිරිපත් කරමින් කාල භේදය තහවුරු කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කර අතීත කාල වාක්‍ය අනතීත කාලයට හැරවීමේ අභ්‍යාසයක් ලබා දෙන්න.
- ඇමුණුම අංක 01හි සඳහන් අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- වාක්‍යවල අතීත අනතීත කාල භේදය දැක්වෙන සටහනක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නිවැරදි ව උක්තය හා ආඛ්‍යාතය යොදා වාක්‍ය ලියයි.
- උක්තය, කර්මය හා ආඛ්‍යාතය අනුව වාක්‍ය නිවැරදි කර ලියයි.
- ආඛ්‍යාතය නිවැරදි ව යොදා වාක්‍ය ලියයි.
- කාල භේදය නිවැරදි ව භාවිත කර වාක්‍ය ලියයි.

**ඇමුණුම 01**

1. නිවැරදි උක්ත පදය යොදා හිස්තැන් පුරවන්න.

   1. .................................... දක්ෂයෝ වෙමු.
   2. .................................... හේන් වගා කරති.
   3. .................................... බඩු විකුණයි.
   4. .................................... බත් පිසුවා ය.

2. නිවැරදි ආඛ්‍යාත පදය යොදා හිස්තැන් පුරවන්න.

   1. ළමයි පාසල ඇරී ගෙදර ....................................
   2. කම්කරුවෝ පාලම ....................................
   3. ගංගා මුහුදට ගලා ....................................
   4. නංගී පොත් ....................................

2. උක්තයට අනුව ආඛ්‍යාතය නිවැරදි කරන්න.

   1. තරු පෙළ අහසේ බබළති.
   2. මම ගමට ගියෙමු.
   3. අපි ඊයේ කොළඹ යමි.
   4. ඊයේ රෑ තාත්තා ගෙදර එයි.

## 19. රාජකාරි ලිපි

**නිපුණතාව** : 7.0 භාෂාව නිරවුල් ව නිවැරදි ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 7.1 තොරතුරු සන්නිවේදනය සඳහා ලිපි ලියයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- රාජකාරි ලිපියක ඇතුළත් මූලිකාංග නම් කරයි.
- තොරතුරු සන්නිවේදනය සඳහා ලිපි ලිවීමේ වැදගත්කම විස්තර කරයි.
- ලිපි ලිවීමේ දී ශිල්පීය ප්‍රයෝග භාවිත කරයි.
- යෝග්‍ය ආකෘති භාවිත කරමින් ලිපි ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- සන්නිවේදනය සඳහා භාවිත කළ හැකි විවිධ ක්‍රම අතර ලිපි ලිවීම සඳහා හිමි වන වැදගත්කම ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ලිවීමේ අරමුණ අනුව ලිපියේ ආකෘතිය වෙනස් වන බවත් ඒ අනුව ලිපි, වර්ග කළ හැකි බවත් හඳුන්වා දෙන්න.
- තෝරා ගත් රාජකාරි ලිපියක් ශිෂ්‍යයෙකු ලවා පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ ඔස්සේ රාජකාරි ලිපි ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.
- රාජකාරි ලිපියක සම්මත ආකෘති ඇති බව පැහැදිලි කර ඇමුණුම 1හි ඇතුළත් එම ආකෘති ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න.
- ඒ ඇසුරෙන් රාජකාරි ලිපියක ඇතුළත් විය යුතු මූලිකාංග පෙන්වා දෙන්න.
  - යවන්නාගේ නම, තනතුර, ලිපිනය හා දිනය
  - ලබන්නාගේ තනතුර, හා ලිපිනය
  - ආමන්ත්‍රණය
  - මාතෘකාව
  - කරුණු
  - අවසානය
- රාජකාරී ලිපි ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
  - සංක්ෂිප්ත බව
  - ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය භාවිත කිරීම
  - පිළිවෙළ, පිරිසිදු බව හා ක්‍රමානුකූල බව රැක ගැනීම
  - රාජකාරි ලිපියේ මාතෘකාවෙන් අන්තර්ගතයේ මූලික අදහස පිළිබිඹු කිරීම
- රාජකාරි ලිපියක් පෞද්ගලික ලිපියකින් වෙනස් වන අයුරු සාකච්ඡා කරන්න.
- ඇමුණුම 1 භාවිතයෙන් රාජකාරි ලිපියක ආකෘතිය සම්පූර්ණ කරලීමේ අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.
- ඇමුණුම 2හි දෙන ලද තේමා අතරින් එකක් තෝරා ගෙන රාජකාරි ලිපියක් ලිවීමට යොමු කරන්න.


**ගුණාත්මක යෙදවුම් :**

- රාජකාරි ලිපියක ආකෘති දැක්වෙන පුවරුවක්
- රාජකාරි ලිපි කිහිපයක්

ඇගයීම් හා තක්සේරුකරණය :

- රාජකාරි ලිපියක ආකෘතිය ඉදිරිපත් කරයි.
- ලිපියකින් ඉටු වන මෙහෙය විස්තර කරයි.
- රාජකාරි ලිපියක් පෞද්ගලික ලිපියකින් වෙනස් වන අයුරු පැහැදිලි කරයි.
- විධිමත් ආකෘතිය භාවිත කරමින් රාජකාරි ලිපියක් ලියයි.

ඇමුණුම 1
රාජකාරි ලිපියක ආකෘතිය i



රාජකාරි ලිපියක ආකෘතිය ii

යවන්නාගේ නම, තනතුර හා ලිපිනය

දිනය

ලබන්නාගේ තනතුර හා ලිපිනය

ආමන්ත්‍රණය

මාතෘකාව

අන්තර්ගත කළ යුතු කරුණු

අවසානය

ඇමුණුම 2

- ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතන්න. ප්‍රදේශය පුරා ව්‍යාප්ත වන මදුරු වසංගතය මර්දනය කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලමින් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා වෙත යැවෙන ලිපියක් සකස් කරන්න.

- පාසල් චාරිකා කමිටුවේ ලේකම් ඔබ යැයි සිතන්න. මෙවර අධ්‍යාපන චාරිකාව සඳහා කොළඹ පිහිටි ග්‍රහලෝකාගාරය නැරඹීමට අදහස් කරන හෙයින් ඒ සඳහා අවසර ඉල්ලමින් ග්‍රහලෝකාගාර අධ්‍යක්ෂතුමා වෙත යැවෙන ලිපියක් සකස් කරන්න.

- 'ජලය සුරකිමු' සංවිධානයේ ලේකම් ඔබ යැයි සිතන්න. ප්‍රදේශයේ ජනතාවට මුහුණ දීමට සිදු ව ඇති පානීය ජල ප්‍රශ්නය විසඳීමට උචිත වැඩ පිළිවෙළක් සකසන ලෙස ඉල්ලමින් ප්‍රාදේශීය ලේකම්තුමා වෙත යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න.

## 20. ආරාධනා පත්‍ර

**නිපුණතාව** : 7.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 7.2 ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- ප්‍රායෝගික අවශ්‍යතා සඳහා භාවිත කරන ලේඛන නම් කරයි.
- සුදුසු ආකෘති භාවිත කරමින් ආරාධනා පත්‍ර නිර්මාණය කරයි.
- අරමුණුවලට ගැළපෙන ලෙස ආරාධනා පත්‍ර නිර්මාණය කරයි.
- ආරාධනා පත්‍ර නිර්මාණයේ දී ශිල්පීය උපක්‍රම භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ප්‍රායෝගික ජීවිතයේ දී පෞද්ගලික වශයෙනුත් සමාජමය වශයෙනුත් උත්සව අවස්ථාවලට මුහුණ දීමට සිදු වන බවත් එහි දී ආරාධනා පත්‍ර සකස් කිරීමේ අවශ්‍යතාව මතුවන බවත් ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- කිසියම් උත්සව අවස්ථාවක් සඳහා සහභාගි වන ලෙස ප්‍රභූන්, විවිධ පුද්ගලයින්, ඥාතීන්, හිතවතුන් වෙත කෙරෙන ලිඛිත ඇරයුම, ආරාධනා පත්‍රයක් බව පෙන්වා දෙන්න.
- මංගල උත්සව, විවෘත කිරීම්, විවිධ රැස්වීම්, මුල්ගල් තැබීම්, තරඟ, පිංකම්, ත්‍යාග ප්‍රදානෝත්සව ආදි විවිධ අවස්ථා අනුව ආරාධනා පත්‍ර සැකසෙන බව පැහැදිලි කරන්න.
- ඇමුණුම 1හි සඳහන් ආරාධනා පත්‍රය ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න.
- ඒ ඔස්සේ ආරාධනා පත්‍රයක අනිවාර්යයෙන් ඇතුළත් විය යුතු ලක්ෂණ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
  - අවස්ථාව හෝ සිද්ධිය
  - දිනය
  - වේලාව
  - ස්ථානය
  - ප්‍රධාන ආරාධිතයාගේ නම
  - ආරාධනා කරන්නේ කවරෙක් ද යන වග
  - ආරාධනා කරන දිනය
  - ලිපිනය

- ආරාධනා පත්‍ර සැකසීමේ දී විශේෂයෙන් සැලකිලිමත් විය යුතු පහත සඳහන් කරුණු පිළිබඳ ව සාකච්ඡා කරන්න.

  - අක්ෂර වින්‍යාසයේ නිවැරදි බව
  - පැහැදිලි අත් අකුරු භාවිතය
  - පිළිවෙළ, ක්‍රමානුකූල බව, පිරිසිදු බව
  - සංක්ෂිප්ත බව
  - සිත් ගන්නාසුලු නිමාව
  - නිර්මාණශීලී බව

- ඇමුණුම 2හි සඳහන් අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1හි සඳහන් ආරාධනා පත්‍රය
- ඇමුණුම 2හි සඳහන් අභ්‍යාස
- විවිධ ආරාධනා පත්‍ර කිහිපයක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ආරාධනා පත්‍රයක ස්වභාවය විස්තර කරයි.
- ආරාධනා පත්‍රයක ඇතුළත් විය යුතු මූලික ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ආරාධනා පත්‍ර සැකසීමේ දී ශිල්පීය උපක්‍රම භාවිත කරයි.
- විවිධ අවස්ථාවලට ගැළපෙන සේ ආරාධනා පත්‍ර සකස් කරයි.

ඇමුණුම 1

# ආරාධනා!

වීරදෙණිය

**සුදර්ශි විද්‍යාලයේ**

**නෙමහල් පුස්තකාල ගොඩනැගිල්ල**
**විවෘත කිරීම**

2015 සැප්තැම්බර් මස 17 වැනි

බදාදා දින පෙ. ව. 10.00 ට

**ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ**

**ප්‍රධානත්වයෙන්**

සිදු කෙරේ.

එම සුවිශේෂ අවස්ථාවට සහභාගි වන ලෙස

ඔබ වහන්සේට/ඔබතුමාට/ඔබතුමියට

ගෞරවයෙන් ඇරයුම් කර සිටිමු.

සංවිධායක මණ්ඩලය,
සුදර්ශි විද්‍යාලය,
2015.08.02 වීරදෙණිය.

ඇමුණුම 2

- ඔබ පාසලේ වර්ෂ අවසානයේ පැවැත්වෙන ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා සහභාගි වන ලෙස ඉල්ලමින් ආරාධිතයින් වෙත යැවීමට සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න.

## 21. සිනා කුමරි (නූතන කවි)

**නිපුණතාව** : 11.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 11.2 සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- නිර්දිෂ්ට කවි පෙළ ගායනා කරයි.
- කවි පෙළෙන් ධ්වනිත වන අදහස් හා හැඟීම් විස්තර කරයි.
- කවි පෙළෙහි ගැබ් වූ සාහිත්‍යමය ලක්ෂණ සාකච්ඡා කරයි.
- කවි පෙළ රස වින්දනයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පෙළ පොතෙහි ඇතුළත් 'සිනා කුමරි' (සිලිලාරෙක හෙල්මැලි) නම් වූ පැදි පෙළ සුදුසු ක්‍රමවේදයක් මගින් ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- පසුව පැදි පෙළ කියවීමට යොමු කරන්න.
- කවි පෙළෙන් ධ්වනිත වන අදහස් හා හැඟීම් පිළිබඳ ව ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
- කවි පෙළ රසවත් වීමට හේතු වී ඇති කරුණු මතු කරන්න.
- රිද්මය, තාලය, භාවිත වචන, පරිසර වර්ණනා පිළිබඳ ශිෂ්‍යයන්ගේ ප්‍රතිචාර ලබා ගෙන ප්‍රතිපෝෂණයක යෙදෙන්න.
- කවි පෙළ රසවත් වීමට හේතු වී ඇති කරුණු ගොනු කර රසාස්වාදයක් ලිවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

**ගුරුභවතාගේ අතිරේක පරිශීලනය සඳහා -**

- සාහිත්‍ය විද්‍යාව - එදිරිවීර සරච්චන්ද්‍ර
- කල්පනා ලෝකය - එදිරිවීර සරච්චන්ද්‍ර

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කවි පෙළට පාදක වූ අත්දැකීම විස්තර කරයි.
- කවි පෙළ රසවත් වීමට හේතු පැහැදිලි කරයි.
- කවි පෙළ රස වින්දනයේ යෙදෙයි.

## 22. රස කවි ගොතමු, කවි රස විඳිමු (පද්‍ය නිර්මාණය)

**නිපුණතාව** : 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 12.1 පද්‍ය රචනා නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- විවිධ කාව්‍ය නිර්මාණවලට පදනම් වූ අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණයේ දී යොදා ගෙන ඇති කාව්‍ය උපක්‍රම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විවිධ ආකෘති භාවිත කරමින් කවි නිර්මාණය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- උසස් වින්දනාත්මක කලා මාධ්‍යයක් ලෙස 'කවිය' පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
    - කවියාගේ අත්දැකීම
    - කවියේ ආකෘතිය
    - විරිත
    - භාෂාව
    - අපූර්වත්වය
    - ජීවන දෘෂ්ටිය
- පද්‍ය නිර්මාණකරණය සඳහා සුදුසු අත්දැකීම් පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
    - පෞද්ගලික අත්දැකීම්
    - සිතුවිලි
    - පොදු අත්දැකීම්
    - ස්වාභාවික පරිසරයේ සංසිද්ධි

    මේ සඳහා නිදර්ශන ලෙස ඇමුණුම 1හි සඳහන් කවි යොදා ගන්න.
- ඇමුණුම 2හි සඳහන් කවි පද සම්පූර්ණ කිරීමේ අභ්‍යාසයක ශිෂ්‍යයන් නිරත කරවන්න.
- ඇමුණුම 3හි සඳහන් තේමා ඔස්සේ පද්‍ය නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන්ගේ පද්‍ය පිළිබඳ නිර්මාණ ඇගයීමක් සිදු කොට සාර්ථක කවි, නිර්මාණ පුවරුවට/ බිත්ති පුවත් පතට යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කාව්‍ය නිර්මාණයට සුදුසු අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- කාව්‍ය නිර්මාණයේ දී කාව්‍යෝපක්‍රම යොදා ගනියි.
- විවිධ ආකෘති භාවිත කරමින් කවි නිර්මාණය කරයි.

ඇමුණුම 1

1. අහසේ තරු වැල් පිරිලා
පොළොවේ සුදු මල් පිපිලා
මගුල් ගෙවල් දෙකක් වගෙයි
මේ දෙපළම හැඩ ගැහිලා

- එස්. මහින්ද හිමි -

2. උණු වැඩියැයි හිරුගෙ රැස්
තෙමා නැවැතැ ගෙනෙන ලෙස්
ගියේයැ වැදැ මුහුදු කුස්
පෙනේ ද ආදර වෙසෙස්

- කුමාරතුංග මුනිදාස -

3. වෙසක් පෝය දා හුළඟක් වෙන්නට
අම්මට කියනව හඳපානේ
වලාකුළක් උඩ මාත් නැගීලා
යනවා හැම තරුවක් ගානේ

- ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ - -

4. වැහි වැහැලා ගල ආඳා බඩේ උනා
අම්මා එදත් ඒ ගල මුදුනට ම උනා
රුටා ගිහිං පාවුල ගලටත් රිදුණා
අම්මා තිව් විලාපය තවමත් ඇසෙනා

- නන්දන වීරසිංහ -

5. මේරි අම්මා දෑත බැඳගෙන
තව ම ගාථා කියනවා
හිතේ බුදු සිරිපතුල ඇඳගෙන
හිතෙන් පැදකුණු කරනවා
ආයෙමත් බිම බලනවා
පුංචි නෝනා නිවන් යන දා
නිවන් දොරකඩ ගේට්ටුව ළඟ
පාවහන් දෙක බලාගෙන මම
නිවී සැනසී ඉන්නවා
එහෙම ඉඳගෙන වඳිනවා
ඒ පිනත් මම පුංචි නෝනට
අනුමෝදනා කරනවා ....

- රත්න ශ්‍රී විජේසිංහ -

6. උපන් බිමට නුඹ වැඩිවා මිසක දුවේ
වැදූ මවට නුඹ වැඩියක් වී ද දුවේ
දුක උහුලා ඉන්නට මට හැකිය දුවේ
නැව් නැගිලා දුරු රටකට යන්න දුවේ

- දයාසේන ගුණසිංහ -

ඇමුණුම 2

**පහත සඳහන් කවිවල හිස් තැන්වලට සුදුසු කවි පද නිරිමාණය කරන්න.**

1. **කළු හීනටි බතේ**
   **සුවඳයි ඇල් කෙතේ**
   **ඇයි මේ නිදිමතේ**
   ..............................................................

2. **හේනට කුඹුරට යන ගැමියන්නේ**
   **පාසල් යන සුරතල් දරුවන්නේ**
   ..........................................................................................
   ..........................................................................................

3. **ඇති නැති භේදය නැත විමසන්නේ**
   ..........................................................................................
   ..........................................................................................
   ..........................................................................................

- කාව්‍ය නිර්මාණයට පෙරහුරුවක්, ටිකිරි බණ්ඩාර සිලෝගම -

ඇමුණුම 3

පහත සඳහන් තේමා අතරින් ඔබ වඩාත් කැමති තේමාවක් තෝරා ගෙන කවි පෙළක් නිර්මාණය කරන්න.

1. අම්මා
2. වනයක අසිරිය
3. සුන්දර සිරිලක
4. සෙනෙහෙබර ගුරු මෑණියනි/ ගුරු පියාණෙනි
5. බක් මහ ඇවිත්

## 23. වාක්‍ය රචනය

**නිපුණතාව** : 8.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 8.1 කරුණු සංවිධානය කර ගනිමින් මාතෘකානුකූල ව රචනා ලියයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- නිවැරදි ව රචනා සැකිල්ලක් සකස් කරයි.
- නිර්මාණාත්මක ව රචනා ගොඩනගයි.
- මාතෘකාවලට අදාළ සාරවත් කරුණු ඉදිරිපත් කරමින් රචනා ලියයි.
- රචනා ලිවීමේ දී භාෂාව නිවැරදි ව භාවිත කරයි.
- රචනා ලිවීමේ දී ශිල්පීය උපක්‍රම අනුගමනය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ආදර්ශ රචනා කිහිපයක් ඇසුරින් වාක්‍ය රචනා ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක නිරත වන්න.
    - රචනා මාතෘකාවක් තෝරා ගැනීම
    - මාතෘකාව ඔස්සේ කරුණු රැස් කිරීම.
    - රචනා සැකිල්ලක් ගොඩනැගීම.
        - හැඳින්වීම
        - ආරම්භය
        - රචනා ශරීරය (අදාළ කරුණු)
        - අවසානය
    - සුදුසු පරිදි ඡේද වෙන් කරමින් ලිවීම.
    - නිර්මාණාත්මක ලෙසත් තර්කානුකූල ලෙසත් කරුණු ඉදිරිපත් කිරීම.
- රචනයක තිබිය යුතු ශිල්පීය උපක්‍රම පැහැදිලි කරන්න.
    - උක්ත ආඛ්‍යාතය සම්බන්ධය
    - අක්ෂර වින්‍යාසය
    - වචන වෙන් කිරීම
    - අත් අකුරු
- ඇමුණුම 1හි සඳහන් මාතෘකා අනුව වාක්‍ය රචනා ලිවීමට ශිෂ්‍යයින් යොමු කරන්න.
- තෝරා ගත් රචනා කිහිපයක් පන්තියට ඉදිරිපත් කර ඇගයීමක යෙදෙන්න.
- සාර්ථක වාක්‍ය රචනා බිත්ති පුවත් පතට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ආදර්ශ රචනා කිහිපයක්

**ඇගයීම් හා තක්සේරුකරණය :**

- සාර්ථක වාක්‍ය රචනයක තිබිය යුතු ලක්ෂණ ප්‍රකාශ කරයි.
- මාතෘකාවකට අනුව වාක්‍ය රචනා ලියයි.
- රචනා ලිවීමේ දී ශිල්පීය උපක්‍රම භාවිත කරයි.

ඇමුණුම 1 :

**පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන රචනයක් ලියන්න.**

- පරිසරය සුරකිමු
- මා දුටු සීගිරිය
- ලොව දිනන දරුවෝ අපි වෙමු
- හොඳ සිරිත් පුරුදු වෙමු
- කියවීමේ අගය

## 24. අපි නිවේදන කියවමු

**නිපුණතාව** : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 1.5 නිරවුල් ව හා නිවැරදි ලෙස බස හසුරුවමින් හඬ පාලනයෙන් යුතු ව කතා කරයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- නිවැරදි ව බස හසුරුවමින් කතා කරයි.
- අන්‍යයන්ගේ අවධානය යොමු වන පරිදි හඬ පාලනයෙන් යුක්ත ව කතා කරයි.
- නිරවුල් ව හා පැහැදිලි ව තම අදහස් ප්‍රකාශ කරයි.
- සංයමයෙන් යුක්ත ව කතා කරයි.
- මාතෘකාවට අදාළ ව කතා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පාසලේ විවිධ අවස්ථාවල දී සිදු කෙරෙන නිවේදන පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- එවැනි නිවේදනවල වැදගත්කම සාකච්ඡා කර නිවේදනයක ගුණාත්මක බව රැක ගැනීම සඳහා එම නිවේදනවල තිබිය යුතු ගුණාංග පහත කරුණු ඔස්සේ සාකච්ඡා කරන්න.
  - නිවැරදි ව භාෂාව භාවිත කිරීම.
  - නිවේදනයෙන් කියවෙන පණිවිඩය තේරුම් ගැනීමට පහසු වන පරිදි අර්ථවත් ව හඬ පාලනය කිරීම.
  - සංයමය ආරක්ෂා කර ගනිමින් නිවේදනයක් කිරීම.
  - නිවේදනයේ අන්තර්ගතය අනුව හඬ භාවිතයේ දී විශේෂ අවධානය යොමු කිරීමේ අවශ්‍යතාව

    නිදසුන් :
    - උත්සවයක දී
    - ආගමික කටයුතුවල දී
    - ක්‍රීඩා තරගයක දී
    - එදිනෙදා සිදු කෙරෙන නිවේදනවල දී
    - කනගාටු දායක නිවේදනවල දී
- ඉහත සඳහන් අවස්ථා අනුව නිවේදනයෙහි ස්වරූපය වෙනස් වන බව පැහැදිලි කරන්න.
- ශිෂ්‍යයන් සුදුසු  පරිදි කණ්ඩායම් කිහිපයකට වෙන් කර ඉහත දක්වා ඇති අවස්ථාවක් එක් එක් කණ්ඩායමකට තෝරා ගැනීමට සලස්වන්න.
- තෝරා ගත් මාතෘකාවට අනුව නිවේදනයක් සඳහා අවශ්‍ය තොරතුරු රැස් කර ගැනීමට උපදෙස් ලබා දෙන්න.
- රැස්කර ගත් තොරතුරු ඇසුරෙන් නිවේදනයක් සකස් කර, එම නිවේදනය පන්තියට ඉදිරිපත් කිරීම සඳහා කේවල පැවරුමක් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- විවිධ අවස්ථා සඳහා යොදා ගන්නා නිවේදන/ ගුවන්විදුලි නිවේදන

**ඇගයීම් හා තක්සේරුකරණය :**

- විවිධ නිවේදන අවස්ථා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිවේදනයේ අන්තර්ගතය අනුව ඉදිරිපත් කිරීමේ ස්වරූපය වෙනස් විය යුතු ආකාරය විස්තර කරයි.
- නිවේදනයේ දී භාෂාව නිවැරදි ව භාවිත කරයි.
- උචිත ලෙස බස හසුරුවමින් හඬ පාලනයෙන් යුක්ත ව නිවේදනයේ යෙදෙයි.

## 25. ලොවට තර්ජනයක් වන විද්‍යුත් අපද්‍රව්‍ය (පුවත් පත් ලිපි/ සඟරා ලිපි)

**නිපුණතාව** : 8.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 8.2 පාඨකයා ආකර්ෂණය වන පරිදි අදහස් ඉදිරිපත් කරමින් නිර්මාණාත්මක ව ලියයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- නිර්මාණාත්මක ලිපියක ලක්ෂණ හඳුන්ව යි.
- පාඨකයා ආකර්ෂණය වන පරිදි ලිපි සකසන ආකාරය විස්තර කරයි.
- භාෂාව නිවැරදි ව භාවිත කරමින් ලිය යි.
- බිත්ති පුවත් පත් සහ සඟරා සඳහා නිර්මාණාත්මක ලිපි ලියයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

- පෙළ පොතේ පාඩම කියවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ ඇසුරෙන් බිත්ති පුවත් පත් /සඟරා ලිපියක අඩංගු කරුණු හා ලිපි ලියන ආකාරය ගැන කෙටි හැඳින්වීමක් කරන්න.
- විවිධ ලිපි ඇතුළත් කොට බිත්ති පුවත් පතක් සැකසීමට ශිෂ්‍යයන්ට උපදෙස් ලබා දෙන්න.
- මෙහි දී පහත සඳහන් ලිපි වර්ග ඇතුළත් කළ හැකි බව දන්වන්න.

  ගද්‍ය ලිපි
  පද්‍ය (සඳැස්/නිසඳැස්)
  කෙටිකතා
  විවිධ තොරතුරු
  සොයා ගැනීම්
  නව නිර්මාණ

- බිත්ති පුවත් පත ප්‍රදර්ශනය සඳහා සුදුසු ස්ථානයක් පිළියෙල කර දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- $A_4$ කඩදාසි
- බ්‍රිස්ටල් බෝඩ්
- මාකර් පෑන්
- පාට කුරු

**ඇගයීම් හා තක්සේරුකරණය :**

- නිර්මාණාත්මක ව ලියවුණු ලිපි කියවයි.
- බිත්ති පුවත් පතක් සඳහා ලියවුණු නිර්මාණාත්මක ලිපි අගය කරයි.
- බිත්ති සඟරාවක් සඳහා විවිධ ලිපි ලියයි.
- බිත්ති සඟරාවක් සකස් කොට ප්‍රදර්ශනය කරයි.

# 26. පද බෙදීම

**නිපුණතාව** : 4.0 ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.2 පද බෙදීමේ සම්මත රීති අනුගමනය කරමින් ලියයි.

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල** :

- පද බෙදීමේ රීති විස්තර කරයි.
- අර්ථවත් ව පද බෙදා ලිවීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- නිවැරදි ව පද බෙදා ලියයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

- පද බෙදීම සම්බන්ධ 6 ශ්‍රේණියේ දී උගත් කරුණු සිහිපත් කර දෙන්න.
- නිවැරදි ව පද බෙදා ලිවීම නිවැරදි අර්ථාවබෝධයට ප්‍රයෝජනවත් වන බව නිදසුන් මගින් පැහැදිලි කරන්න.

නිදසුන්

| වැරදි | නිවැරදි |
|---|---|
| බෙනෝ කනයෙක්<br>ඔහු ද කුණු කකුළ පෙරට තබා | බෙනේක නයෙක්<br>ඔහු දකුණ කකුළ පෙරට තබා |

- වල්, හි, ගෙන්, ආදි ප්‍රත්‍ය වචනයට එක් කොට ලිවිය යුතු බව උදාහරණ ඇසුරෙන් පැහැදිලි කර දෙන්න.
  උදා : නගරයන්හි, ගමෙහි, ගෙවල්වල, කර්මාන්තවල
  ඔහුගෙන් , මවගෙන්
- පෙළ පොතේ සඳහන් අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- වැරදි සහගත පද බෙදීම හා නිවැරදි පද බෙදීම සහිත ඡේද දෙකක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- පද බෙදීම සම්බන්ධයෙන් උගත් රීති ඉදිරිපත් කරයි.
- පද වෙන් කොට ලිවීම අගය කරයි.
- පද එක් ව ලිවිය යුතු තැන් ප්‍රකාශ කරයි.
- පද වෙන් ව ලිවිය යුතු තැන් ප්‍රකාශ කරයි.
- භාෂා කාර්යයේ දී පද වෙන් කොට ලියයි.
- ලේඛන නිවැරදි කිරීමේ දී පද බෙදීමේ රීති අනුගමනය කරයි.

## 27. සකි සඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර

**නිපුණතාව** : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 9.1 සංස්කෘතික උරුමය හා හර පද්ධති පිළිබඳ ව අවබෝධය ලබා ගැනීම සඳහා ලිපි ලේඛන පරිශීලනය කරයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- සංස්කෘතික උරුමය යනු කුමක් දැයි පැහැදිලි කරන්න.
- සංස්කෘතික උරුමය ගැන ලිය වී ඇති ලිපි ලේඛන කියවයි.
- සංස්කෘතික උරුමය අගය කරමින් අදහස් දක්වයි.
- ශ්‍රී පාදය ගැන ලියැවී ඇති විවිධ නිර්මාණ කියවයි.
- ශ්‍රී පාදය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පහත සඳහන් ගීත ඛණ්ඩය ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.

  සමනොළ ගිරි වළලු බිමේ
  මුනි සිරිපා පිපෙන හිමේ
  සම කරුණා ගුණ මහිමේ
  අප උපතින් ලද උරුමේ

- ශ්‍රී පාද අඩවිය හා ශ්‍රී පාද වන්දනාව පිළිබඳ සාකච්ඡාවක් ගොඩනගන්න.
  - ශ්‍රී පාදය පිළිබඳ ඓතිහාසික තොරතුරු.
  - ශ්‍රී පාද වන්දනය සමග බැඳී ඇති විවිධ සිරිත් විරිත්.
  - ශ්‍රී පාද සාහිත්‍යය (ජන කවි, ජන ගී, ජන ප්‍රවාද, වෙනත් පොත පත)
  - ජෛව පද්ධතියක් වශයෙන් ශ්‍රී පාද අඩවියේ වැදගත්කම.
  - වෙනත් ආගමිකයන්ගේ පූජනීය ස්ථානයක් වශයෙන් ද සැලකෙන බව.
- සුදුසු පරිදි ශිෂ්‍යයන් කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 1හි සඳහන් ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ඇගයීම් හා තක්සේරුකරණය :**

- ශ්‍රී පාදය සංස්කෘතික උරුමයක් ලෙස හඳුනා ගෙන විස්තර කරයි.
- ශ්‍රී පාදයේ සංස්කෘතික උරුමය අගය කරයි.
- ශ්‍රී පාදය ඇසුරෙන් බිහි වූ සාහිත්‍ය නිර්මාණ එක් රැස් කරයි.
- ශ්‍රී පාදය ජාතික උරුමයක් ලෙස රැක ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.

ඇමුණුම 1 :

පැවරුම -

1. ශ්‍රී පාදය හා බැඳුණු සිරිත් විරිත් ගොනු කරන්න.
2. ශ්‍රී පාදය ජෛව පද්ධතියක් වශයෙන් ආරක්ෂා කර ගැනීමේ වටිනාකම ඉදිරිපත් කරන්න.
3. ශ්‍රී පාදය ඇසුරෙන් නිර්මාණය වී ඇති සාහිත්‍යය නිර්මාණ එක් රැස් කරන්න.
4. ශ්‍රී පාදය පිළිබඳ තොරතුරු ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරන්න.

## 28. තනි පද

**නිපුණතාව** : 5.0 භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල** :

- තනි පද හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- තනි පදවල ස්වභාවය විස්තර කරයි.
- ලේඛනයේ දී තනි පද අර්ථවත් ව භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- තනි පද යනු කුමක් දැයි හඳුන්වා දෙන්න. (මේ පිළිබඳ විස්තර මූලික වදන් / සංකල්ප යටතේ ඇතුළත් වේ.)
- තනි පද කිහිපයක් නිදර්ශන ලෙස ඉදිරිපත් කරන්න.
  - රාත්‍රියෙහි හැසිරෙන - නිශාචර
  - සමාන නොවන / සදෘශ නොවන - අසදෘශ
  - කළ ගුණ නො සලකන - අකෘතඥ
  - අපායට කෙනෙකු ගෙන යා හැකි - අපායගාමී
  - උපතින් ලද නුවණ - සහබුද්ධිය
- ඇමුණුමෙහි සඳහන් වාක්‍යවල අදාළ කොටස් සඳහා තනි පද යොදා වාක්‍ය නැවත ලිවීමේ ක්‍රියාකාරකමක ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන්/ සංකල්ප :**

- තනි පද - පද කිහිපයකින් හෝ වාක්‍යාංශයකින් හෝ දැක්වෙන අදහසක් එක පදයකින් ප්‍රකාශ කිරීමයි.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම අංක 1හි දැක්වෙන අභ්‍යාසය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- තනි පද යනු මොනවාදැයි විස්තර කරයි.
- තනි පද යොදා වාක්‍ය නිර්මාණය කරයි.
- තනි පද එක් රැස් කරයි.

ඇමුණුම - 1

පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද සඳහා සුදුසු තනි පද වරහනින් තෝරා වාක්‍ය නැවත ලියන්න.

1. **බොහෝ දුර දකින** නායකයෝ සමාජයට යහපතක් කරන්නෝ ය.

2. **උපතින් ලද නුවණක්** සහිත මහෞෂධ පඬිතුමා එරට බොහෝ ගැටලු විසඳුවේ ය.

3. **හිරු අවරට යාමෙන් පසු ආහාර අනුභව කිරීම** භික්ෂූන් වහන්සේට අකැප ය.

4. **සිය දේශයට විරුද්ධ ක්‍රියාවන්හි** නියැලීම නුසුදුසු ය.

5. **පුරාණ කාලයට අයත්** සාහිත්‍යය පොත් පත් පරිශීලනය භාෂා පෝෂණයට ඉවහල් වේ.

6. **පහ වූ රාග ක්ලේශ ඇති** උතුමෝ අතීත ලංකාවෙහි විසූහ.

7. ජීවිතය යහපත් කර ගැනීම සඳහා **අන්‍යයන් දෙන උපදේශ** සිහිනුවණින් පිළිපැදිය යුතු ය.

8. කුරුණෑගල රාජධානිය **පර්වත ආදියෙන් වට වී තිබූ** නිසා රජවරුන්ට ආරක්ෂා සහිත ස්ථානයක් විය.

9. නාට්‍යයක ප්‍රධාන අරමුණ වන්නේ **රස ජනනය කිරීම** යි.

10. **නොයෙක් දේශයන්හි සැරිසැරූ** භික්ෂුවක වූ පාහියන් ලංකාවට ද පැමිණියේ ය.

(රසෝත්පත්තිය, ගිරිදුර්ග, දේශාටක, පරෝපදේශ, දූරදර්ශී, විකාලභෝජනය, පෞරාණික, දේශද්‍රෝහී, සහබුද්ධිය, නික්ලේශී)

## 29. සුදන ගුණ (ලෝකෝපකාරය හා තිරුක්කුරල්)

**නිපුණතාව** : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 9.2 පොත පත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි.

**කාලච්ඡේද** : 08 යි.

**ඉගෙනුම් පල** :

- උපදේශ ග්‍රන්ථවලින් නිරූපිත සාරධර්ම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සාරධර්ම අර්ථකථනය කරයි.
- ප්‍රායෝගික ජීවිතයට සාරධර්ම උපයෝගි වන ආකාරය පැහැදිලි කරයි.
- උපදේශ ග්‍රන්ථවල ඇතුළත් සාරධර්ම අනුගමනය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පාඩමේ සඳහන් කවි පන්ති දෙක ශිෂ්‍යයන්ට ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- අනතුරු ව එම කවි පන්ති පිළිබඳ සාකච්ඡා කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
- පළමු වන කණ්ඩායමට ලෝකෝපකාරයේ පද්‍යවල ඇතුළත් සාරධර්ම සටහන් කර ගැනීමට සලස්වන්න.
- දෙ වන කණ්ඩායමට තිරුක්කුරල් කවිවල ඇතුළත් සාරධර්ම සටහන් කර ගැනීමට සලස්වන්න.
- සැම කවියක ම ඇති උපමා එක්රැස් කිරීමට කණ්ඩායම් දෙක යොමු කරන්න.
- ඒ අනුව කණ්ඩායම් දෙකට 'කළගුණ සැලකීම' සහ 'සුදන ගුණ' යන මාතෘකා දෙක යටතේ තම අනාවරණ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- සමාලෝචනයේ යෙදෙන්න.
- ප්‍රායෝගික ජීවිතයට මේ සාරධර්ම උපයෝගී වන අයුරු පැහැදිලි කරන්න.
- සාරධර්ම ඇතුළත් වෙනත් උපදේශාත්මක කාව්‍ය ග්‍රන්ථ කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

**මූලික වදන්/ සංකල්ප :**

- සාරධර්ම - සමාජය විසින් යහපත් යැයි සැලකෙන ගුණාංග

**ගුණාත්මක යෙදවුම් :**

- ලෝකෝපකාරය -
- තිරුක්කුරල් -

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සාරධර්ම ඇතුළත් උපදේශ ග්‍රන්ථ හඳුනා ගෙන නම් කරයි.
- සාරධර්ම අර්ථකථනය කරයි.
- යහපත් ජීවිතයකට සාරධර්ම අවශ්‍ය බව පැහැදිලි කරයි.
- පාඩමේ එන සාරධර්ම හඳුන්වයි.
- කවි පෙළෙහි ඇති උපමා ලියා දක්වයි.

## 30. මා දුටු මුල් හිරු පෙන්වූ ලංකා (දේශාභිමානී ගීතය)

**නිපුණතාව** : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 9.3 දේශාභිමානී හැඟීම් දනවන සාහිත්‍ය නිර්මාණ ඇසුරු කරයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- දේශාභිමානී හැඟීම් දනවන පද්‍ය නිර්මාණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- දේශාභිමානී ගීතයෙන් ධ්වනිත වන අදහස් අගය කරයි.
- ගීතයේ දේශාභිමානී හැඟීම් දනවන අවස්ථා උපුටා දක්වයි.
- දේශාභිමානී ගීතය පිළිබඳ රසාස්වාදයක් ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- දේශාභිමානය දනවන ගීතයකට සවන් දීමට සලස්වමින් දේශාභිමානී ගීතයකින් බලාපොරොත්තු වන අරමුණු පිළිබඳ ව ශිෂ්‍යයන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.
- එහි දී පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කරන්න.
  - රචකයා යොදා ගෙන ඇති අත්දැකීම
  - දේශිහිමානය දැනවීම සඳහා රචකයා යොදා ගෙන ඇති භාෂාව
  - දේශාභිමානය දැනවීම සඳහා රටේ ස්වභාවික සම්පත්, පරිසරය, ශ්‍රී විභූතිය, අතීත උරුමය ආදී විවිධ ක්ෂේත්‍ර යොදා ගත හැකි බව පෙන්වා දෙන්න.
- 'මා දුටු මුල්හිරු පෙන් වූ ලංකා' ගීතය සවන් දීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ගීතය ගැන ශිෂ්‍යයන්ගේ අදහස් විමසමින් මෙම ගීතය නිර්මාණයෙන් විස්තර කෙරෙන අත්දැකීම පිළිබඳ සාකච්ඡා කරන්න.
- ඒ සඳහා රචකයා යොදා ගෙන ඇති භාෂාව හා කාව්‍ය උපක්‍රම පැහැදිලි කරන්න.
- ගීතය නැවත සවන් දීමට යොමු කරන්න.
- ශිෂ්‍යයන් සවන් දුන් ගීත එකතු කර දේශාභිමානී ගී පොතක් නිර්මාණය කරවන්න.
- තමන් තෝරා ගත් දේශාභිමානී ගීතයක් පිළිබඳ ව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- දේශාභිමානී ගීත

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දේශාභිමානී හැඟීම් දනවන ගීත නම් කරයි.
- දේශාභිමනී ගීතවලට සවන් දී අගය කරයි.
- දේශාභිමානී ගීතවලට සවන්දෙයි.
- දේශාභිමානී ගීත රැස් කරයි.

## 31. දුං දුමටයි අඟුරු මටයි (ගුවන්විදුලි වැඩසටහන)

**නිපුණතාව** : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 1.4 සාවධාන ව සවන් දී තොරතුරු රැස් කරයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- සාවධාන ව සවන් දී වැදගත් තොරතුරු සටහන් කර ගනියි.
- සටහන් කර ගත් තොරතුරු අවස්ථානුකූල ව ඉදිරිපත් කරයි.
- ගුවන්විදුලි වැඩසටහනක අන්තර්ගතය අගය කරයි.
- රැස් කර ගත් තොරතුරු අවස්ථෝචිත ව භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ගුවන්විදුලි වැඩසටහනක ස්වරූපය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ගුවන්විදුලි වැඩසටහනකට සවන් දීමට පෙර ඒ සඳහා සුදුසු උපදෙස් ලබා දෙන්න.
  - එහි දී නිශ්ශබ්දතාව, මානසික සංයමය, සුදුසු පරිසරය සකස් කර ගැනීම, අවශ්‍ය තොරතුරු සටහන් කර ගැනීම ආදි කරුණු කෙරෙහි අවධානය යොමු කරවන්න.
- 'දුං දුමටයි අඟුරු මටයි' ගුවන්විදුලි වැඩසටහනට සවන් දීමෙන් අනතුරු ව එම වැඩ සටහන ඇසුරෙන් ශිෂ්‍යයන්ගෙන් වාචික ප්‍රශ්න අසා ශිෂ්‍යයන්ගේ සවන් දීමේ හැකියාව පිළිබඳ අවධානය යොමු කරන්න.
- මෙවැනි වැඩසටහන් හඳුනා ගෙන සවන් දීමටත් තොරතුරු රැස් කිරීමටත් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- මහාචාර්ය ජේ. බී. දිසානායකගේ 'දුං දුමටයි අඟුරු මටයි' (තුන්පත් රටා) ගුවන්විදුලි වැඩසටහනේ සංයුක්ත තැටියක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ගුවන්විදුලි වැඩසටහනක ස්වරූපය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ගුවන්විදුලි වැඩසටහනකට සවන් දීම සඳහා පෙර සූදානම අගය කරයි.
- වැදගත් තොරතුරු මතකයේ තබා ගෙන සටහන් කර ගනියි.
- රැස් කර ගත් තොරතුරු අවස්ථෝචිත පරිදි භාවිත කරයි.

## 32. විශේෂණ පද

**නිපුණතාව :** 2.0 භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- විශේෂණ පද හඳුනා ගෙන විස්තර කරයි.
- විශේෂණ පදවල ස්වභාවය පැහැදිලි කරයි.
- ලේඛනයේ දී විශේෂණ පද අර්ථවත් ව භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- විවිධ පද වර්ග අතර විශේෂණ පද යන්න පැහැදිලි කර දෙන්න.
  - උදාහරණ සඳහා පහත සඳහන් වාක්‍ය යොදා ගන්න.

  දක්ෂ රියැදුරු රථය වේගයෙන් පදවයි.
  ලොකු අයියා පාඩම ශබ්ද නගා කියවයි.
  අපේ අම්මා රසට උයයි.
- නාම පදයක් හෝ ක්‍රියා පදයක් වර්ණනා කිරීම සඳහා හෝ විස්තර කිරීම සඳහා හෝ යොදන පදය විශේෂණ පද බව පෙන්වා දෙන්න.
- නියමිත පාඩම නිහඬ ව කියවා ගැනීමට සලස්වන්න.
- මෙහි දී ප්‍රධාන අර්ථය දෙන පදය 'විශේෂ්‍යය' ලෙසත් වර්ණනා කෙරෙන පදය 'විශේෂණය' ලෙසත් සලකන බව පැහැදිලි කර දෙන්න.
- උදාහරණ කිහිපයක් මගින් එය තව දුරටත් තහවුරු කරන්න.
- ඇමුණුමෙහි ඇතුළත් අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විශේෂණ පද යනු මොනවා දැයි පැහැදිලි කරන්න.
- නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ සඳහා උදාහරණ ඉදිරිපත් කරයි.
- විශේෂණ පද යොදා වාක්‍ය ලියයි.
- භාෂා භාවිතයේ දී විශේෂණ පද යොදමින් බස රසවත් කර ගනියි.

ඇැමුණුම 1

පහත සඳහන් නාම පද සඳහා සුදුසු විශේෂණ පද හිස්තැනෙහි ලියන්න.

1. ______________ මිනිසා

2. ______________ පුටුව

3. ______________ වෙළෙන්දා

4. ______________ කම්කරුවා

5. ______________ මල

2. පහත සඳහන් ක්‍රියා පද සඳහා සුදුසු විශේෂණ පද හින්තැනෙහි ලියන්න.

1. ______________ නටයි.

2. ______________ දුවයි.

3. ______________ ලියයි.

4. ______________ සලකයි.

5. ______________ පවසයි.

3. පහත සඳහන් වාක්‍යවල හිස්තැන්වල සුදුසු විශේෂණ පද යොදන්න.

1. ______________ අක්කා මල්ලිගෙ ______________ ඇඳුම් සේදුවා ය.

2. ______________ පූසා බෝලය ______________ පෙරළයි.

3. හාවා ______________ කොළ ______________ කෑවේ ය.

4. ______________ බල්ලා ______________ පූසා සමඟ ______________ සෙල්ලම් කරයි.

5. ______________ මල්ලී ______________ පුටුවට ______________ නැග්ගේ ය.

## 33. සකස් කට නොකී කට (ශබ්ද නගා කියවීම)

**නිපුණතාව** : **2.0** ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවයි.
- නිවැරදි හඬ පාලනයෙන් යුතු ව කියවයි.
- අවබෝධයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.
- විරාම ලකුණුවලට අවනත ව කියවයි.
- මනා වේගයක් පවත්වා ගනිමින් කියවයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පන්තියේ සියලු ම සිසුන් කුඩා කණ්ඩායම් කිහිපයකට බෙදා එක් එක් කණ්ඩායමකට පහත සඳහන් ඉගෙනුම් ද්‍රව්‍ය ලබා දෙන්න.
  ශ්ලෝකයක් (ඇමුණුමෙහි සඳහන් වේ. ශබ්ද නගා කියවීම සඳහා පමණි.)
  පුවත්පත් වාර්තාවක්
  පෙළ පොතේ පාඩම
- හඬ පාලනයෙන් යුතු ව කියවීමේ දී තිබිය යුතු ගුණාංග ඉගෙනුම් පලවලට අනුව විස්තර කරන්න.
- බෙදා දෙන ලද කියවීම් ද්‍රව්‍ය කියවීම සඳහා හුරුවීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- කණ්ඩායම් වශයෙන් හුරු වූ කියවීම කේවලව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුමෙහි සඳහන් ශ්ලෝක
- පුවත්පත් වාර්තා කිහිපයක්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- වචන නිවැරදි ව උච්චාරණය කරයි.
- ප්‍රමාණවත් වේගයකින් යුතු ව කියවයි.
- විරාම ලකුණුවලව අවනත ව කියවයි.
- අන්තර්ගතයට උචිත ලෙස හැඟීම් ප්‍රදර්ශනය කරමින් අවබෝධයෙන් යුතු ව කියවයි.

ඇමුණුම 01

## ශ්ලෝක

1. ස්වගෘහේ පූජ්‍යතේ මූර්ඛ:
ස්වග්‍රාමේ පූජ්‍යතේ ප්‍රභු:
ස්වදේශේ පූජ්‍යතේ රාජා
විද්වාන් සර්වත්‍ර පූජ්‍යතේ

2. ආචාර්යාත් පාද මාදත්තේ
පාදං ශිෂ්‍යයම් ස්වමේධයා
පාදං සබ්බ්‍රහ්මචාරීනාම්
පාදං කාලක්‍රමේන ච

3. උද්යෝගේනහි සිද්ධ්‍යන්ති
කාර්යානි න මනෝරථෛ:
න හි සුප්තස්‍ය සිංහස්‍ය
ප්‍රවිශන්ති මුඛෙ මෘගා:

4. ශ්ලෝකාර්ධෙන ප්‍රවක්ෂ්‍යාමි
යදුක්තං ග්‍රන්ථ කෝටිෂු
පරොපකාර: පුණ්‍යාය
පාපාය පරපීඩනම්

ශ්ලෝකවල අර්ථය (ගුරුවරයාගේ ප්‍රයෝජනය සඳහා පමණි.)

1. මෝඩයා සිය නිවසේ දී පිදීමට ලක් වේ.
ප්‍රභුවරයා සිය ගමෙහි දී පිදීමට ලක් වේ.
රජතුමා සිය රටෙහි දී පිදීමට ලක් වේ.
විද්වතා සියලු තැන්හි දී පිදීමට ලක් වේ.

2. ගුරුවරයාගෙන් එක් කොටසක් ඉගෙනගත යුතු ය.
එක් කොටසක් සිය නුවණින් අවබෝධ කටයුතු ය.
එක් කොටසක් එක් ව හැසිරෙන අයගෙන් ඉගෙන ගත යුතු ය.
තවත් කොටසක් කාලයාගේ අවෑමෙන් ඉගෙනගත යුතු ය.

3. සියලු සිතුම් පැතුම් හා කාර්ය උත්සාහයෙන් ම ඉටු වේ.
නිදාගත් සිංහයාගේ කටට සිව්පාවෝ නො පිවිසෙත්.

4. කෝටි ගණනක් වන ග්‍රන්ථවල කියූ දේ ශ්ලෝක භාගයකින් කියමි.
පරෝපකාරය පින් පිණිස වේ. පරපීඩනය පාපය පිණිස වේ.

## 34. විරාම ලකුණු

**නිපුණතාව** : **4.0** ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.1 විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලියයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- විරාම ලකුණු නිවැරදි ව නම් කරයි.
- විරාම ලකුණු නිවැරදි ව යොදමින් ලේඛනයේ යෙදෙයි.
- විරාම ලකුණු නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

- ඇමුණුමෙහි සඳහන් පරිදි කෙටි ඉර යෙදෙන තැන් නිදසුන් මගින් පහදන්න.
- ඇමුණුමේ සඳහන් පරිදි ඇල ඉර යෙදෙන තැන් නිදසුන් මගින් පහදන්න.
- ඇමුණුමේ සඳහන් පරිදි දෙතිත යෙදෙන තැන් නිදසුන් මගින් පහදන්න.
- මේ සඳහා ඇමුණුම 1 යොදා ගන්න.
- පහත සඳහන් අභ්‍යාසයෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.

  අභ්‍යාසය -

  කෙටි ඉර, ඇල ඉර, දෙතිත නිවැරදි ව යොදා පහත සඳහන් වාක්‍ය නැවත ලියන්න.

1. පියා මව දරුවා රැක බලා ගනියි.
2. විදුහල්පතිතුමිය විදුහල්පතිතුමා උත්සවයට පැමිණෙයි.
3. ලේඛකයා ලේඛිකාව පොතක් ලියයි.
4. පුස්ස බිඳිනවා නිෂ්ඵල දෙයක් කිරීම.
5. ඔවුන් අතර මුදල් බෙදී යා යුත්තේ 5 3 අනුපාතය අනුව බව සලකන්න.
6. විමල් දසනායක මහතා 1978 1984 දක්වා 'ප්‍රගති' විද්‍යාලයේ සේවය කළේ ය.
7. චිත්‍ර ප්‍රදර්ශනය පෙ. ව. 8.00 ප. ව. 6.00 දක්වා පැවැත්වේ.
7. කොළඹ මහනුවර මාර්ගය ප්‍රතිසංස්කරණය කෙරේ.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- හඳුනා ගත් විරාම ලක්ෂණ නම් කරයි.
- විරාම ලක්ෂණවල ස්වභාවය පැහැදිලි කරයි.
- විරාම ලක්ෂණ නිවැරදි ව ලේඛනයේ යොදයි.
- විරාම ලක්ෂණ යෙදිය යුතු තැන් ප්‍රකාශ කරයි.

ඇමුණුම 1

- සිංහලයෙහි විරාම ලක්ෂණ හැඳින්වීම සඳහා පහත සඳහන් නිදසුන් පන්තියෙහි ප්‍රදර්ශනය කරන්න.

**කෙටි ඉර** -

- පද සංයුක්ත ව භාවිත කෙරෙන විට අන්‍යෝන්‍ය සම්බන්ධතාව දැක්වීමේ දී

උදා :- සමාජ - දේශපාලන සබඳතා

පාසල - ඉගෙනුම්, ඉගැන්වීම් මධ්‍යස්ථානයකි.

- කාල පරිච්ඡේද දැක්වීමේ දී

  උදා :- බු. ව. 2500 - 5000 දක්වා
  ක්‍රි. ව. 1948 - 1972 දක්වා

- යම් පේළියක වචනයක් ලිවීමට ඉඩ මඳ වූ කල්හි එම වචනයේ කොටසක් පහළ පේළියේ ලිවීමේ දී

උදා :- අවබෝධාත්-
-මක

විමසිලි-
-මත්

ඇල ඉර/

- විකල්ප (වෙනත්) ව්‍යවහාර දැක්වීමේ දී

  උදා :- පැන්සලෙන්/පෑනෙන්/පැහැදිලි ව ලියන්න.
  ගරු ස්වාමීන්වහන්ස/මහත්මයාණෙනි/මහත්මියනි

**දෙතිත :**

- ගණිත ප්‍රකාශනයක අනුපාත දැක්වීමේ දී

  උදා :- මෙම දෙළුම් ගෙඩි ප්‍රමාණය යහළුවන් දෙදෙනා අතර 4 : 8 අනුපාතයට බෙදා දක්වන්න.

## 35. පුස්තකාලයට පිය නගමු (නිශ්ශබ්ද කියවීම)

**නිපුණතාව** : 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 2.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගත් කරුණු ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- අර්ථාවබෝධයෙන් යුතු ව පොත පත කියවයි.
- කියවා අවබෝධ කර ගත් කරුණු ඉදිරිපත් කරයි.
- කියවීමෙන් ලත් දැනුම අවස්ථෝචිත ව භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- නිහඬ ව කියවීමේ ප්‍රයෝජන පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- එහි දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
  - කාලය ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීමට කියවීම ඉවහල් කර ගත හැකි වීම.
  - දැනුම පුළුල් කර ගැනීමට හැකියාව ඇති කර ගැනීම.
  - තොරතුරු රැස් කිරීමේ හැකියාව.
  - විචාරාත්මක චින්තනයට යොමු වීම ආදි සුවිශේෂ හැකියා ඇති කර ගත හැකි වීම.
- 'පුස්තකාලයට පිය නගමු' පාඩම නිහඬ ව කියවා ගැනීමට සලස්වන්න.
- අන්තර්ගත තොරතුරු රැස් කර ගැනීමට යොමු කරන්න.
- වැදගත් කරුණු මතකයේ තබා ගැනීමට හෝ සටහන් කර ගැනීමට හෝ යොමු කරන්න.
- පාඩමෙන් හමු වන අලුත් වචන හඳුනා ගැනීමට යොමු කරන්න.
- ඒවායේ අර්ථය පැහැදිලි කරන්න.
- එම වචන යොදා වාක්‍ය නිර්මාණ කිරීමට යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- පොත පත කියවා අදහස් පළ කරයි.
- කියවීමෙන් ග්‍රහණය කර ගත් තොරතුරු අගය කරයි.
- පොත පත කියවීමෙන් ලද දැනුම අවස්ථෝචිත ව භාවිත කරයි.
- කාලය ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා පොත පත කියවයි.

## 36. තොප්පි වෙළෙන්දා (දෙබස් රචනය)

**නිපුණතාව** : 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 12.3 නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 08 යි.

**ඉගෙනුම් පල** :

- නාට්‍යෝචිත අවස්ථා සහිත කතා වස්තුවක් තෝරා ගනියි.
- තෝරාගත් කතා වස්තුවේ නාට්‍යෝචිත අවස්ථා පෙළ ගස්වයි.
- නාට්‍යෝචිත අවස්ථාවක් සඳහා දෙබස් රචනා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- සෝමලතා සුබසිංහ මහත්මියගේ "තෝප්පි වෙළෙන්දා" නාට්‍යයේ කොටසක් නැරඹීමට / කියවීමට සලස්වන්න.
- මෙම නාට්‍යය සඳහා යොදා ගෙන ඇති කතාන්දරය විස්තර කරන්න.
- කතාන්දරයක සිද්ධි කිහිපයක් පදනම් කර ගෙන නාට්‍යය ගොඩ නගා ඇති ආකාරය පැහැදිලි කරන්න.
- නාට්‍ය නිර්මාණයේ දී ප්‍රධාන කතාවට හානියක් නොවන පරිදි නිර්මාණාත්මක ව අංග එකතු කර ඇති ආකාරය පෙන්වා දෙන්න.
- ඒ සඳහා නාට්‍යයේ පෙළ ඇසුරු කර ගන්න.
- නාට්‍යය සඳහා භාෂාව හැසිර විය යුතු ආකාරය පැහැදිලි කරන්න.
- තමන් දන්නා කතාවක් /අත්දැකීමක් තෝරා ගෙන නාට්‍යයක් නිර්මාණය කිරීමට සුදුසු සිද්ධි හඳුනා ගැනීමට යොමු කරන්න.
- තෝරා ගත් සිද්ධියක් පාදක කර ගෙන නාට්‍යෝචිත දෙබස් නිර්මාණයට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- තොප්පි වෙළෙන්දා (නාට්‍ය පෙළ / DVD ) - සෝමලතා සුබසිංහ

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නාට්‍ය සඳහා උචිත කතා වස්තුවක් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- කතා වස්තුවල නාට්‍යෝචිත අවස්ථා අගය කරයි.
- උචිත අයුරින් භාෂාව භාවිත කරයි.
- තෝරා ගත් සිද්ධියක් ඇසුරෙන් දෙබස් නිර්මාණය කරයි.

## 37. යහළුවෝ (ඊ. ඩබ්. අදිකාරම්තුමා)

**නිපුණතාව** : 10.0 සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු අතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 10.1 සාහිත්‍යික, දාර්ශනික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන ඇසුරු කරයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- ඊ.ඩබ්. අදිකාරම්තුමා පිළිබඳ ලියවුණු ලිපි ලේඛන කියවයි.
- අදිකාරම්තුමා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- අදිකාරම්තුමාගෙන් සිදු වූ සේවය අගය කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- ඊ. ඩබ්. අදිකාරම්තුමා පිළිබඳ පෙළපොතෙහි පාඩම කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ඊ. ඩබ්. අදිකාරම්තුමාගේ අවිහිංසාවාදී පිළිවෙත ප්‍රකට කෙරෙන ඇමුණුම 1 හා 2හි සඳහන් කතා ශිෂ්‍යයන්ට ඉදිරිපත් කරන්න.
- ඊ. ඩබ්. අදිකාරම්තුමාගේ අවිහිංසාවාදී අදහස් පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
- අදිකාරම්තුමා පිළිබඳ ව පෙළපොතේ පාඩමෙන් සහ මෙහි දී ඇති ඡේදවලින් ඉස්මතු වන කරුණු පිළිබඳ සාකච්ඡා කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් හතරකට බෙදන්න. පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
  1 ඊ. ඩබ්ලිව් අදිකාරම්තුමා පිළිබඳ ව තොරතුරු එක්රැස් කරන්න. එතුමාගේ අවධානය යොමු වූ විෂය ක්ෂේත්‍ර හඳුන්වන්න.
  2 අදිකාරම්තුමාගෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදු වූ සේවය පැහැදිලි කරන්න.
  3 අදිකාරම්තුමාගේ ආදර්ශමත් ක්‍රියා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න.
  4 පරිසරවේදියකු ලෙස අදිකාරම්තුමා ඉදිරිපත් කළ අදහස් ගොනු කර දක්වන්න.
- ශිෂ්‍ය ඉදිරිපත් කිරීම්වලට අවස්ථාව ලබා දෙන්න. අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- අදිකාරම්තුමා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- අදිකාරම්තුමාගේ දාර්ශනික අදහස් හඳුනා ගෙන විස්තර කරයි.
- අදිකාරම්තුමාගෙන් සිදු වූ සේවය අගය කරයි.
- අදිකාරම්තුමා පිළිබඳ වැඩිදුර තොරතුරු එක් රැස් කරයි.

ඇමුණුම 1

දිනක් උදෑසනින් ගමනක් යාම සඳහා තම මෝටර් රථයට නැගුණු ඊ. ඩබ්. අදිකාරම්තුමා දුටුවේ පාර හරහා ගමන් කරන කුඹි රැනකි. එම කුඹි රැන මග හැර යාමට අන් දිසාවක් නොවී ය. කුඹි රැන මතින් තම මෝටර් රථය පැද වුවහොත් කුඹින්ට සිදු විය හැකි අනර්ථය සලකා තම මෝටර් රථය ගරාජයේ නවතා බසයෙන් තම ගමන යාම සඳහා පිටත් විය.

ඇමුණුම 2

එක් දිනක් බණ්ඩාරවෙල උයනේ ගසක් යට බංකුවක් මතුයෙහි වාඩි වී බොහෝ වේලාවක් බලා සිටියෙමි. ඉදිරියෙහි වූ පිට්ටනියේ එහා මෙහා පියාඹමින් කිරිල්ලියක් තම කෑදර පැටවාට කෑම කැවුවා ය. අලස ලෙස හෙමින් ඇවිදිමින් තණකොළ කකා සිටි දෙනක් එහි විය. ඒ කුරුල්ලන් ද හරකුන් ද පිට්ටනියේ තණ කොළ ද උයන අවට තිබෙන ගස් ද ඈත පෙනෙන කඳු සහ පතන් ද මා ද එක ම ස්වභාව ධර්මයේ එකිනෙකට වෙන් කළ නොහැකි අවයව බව මොහොතකට පෙනී ගියේ ය වචනයෙන් ප්‍රකාශ කළ නොහැකි ප්‍රීතියක් හා කනගාටුවක් ද එකට වෙලී මා සිත වැළඳ ගත්තේ ය.

(ආචාර්ය අදිකාරම්ගේ මතක සටහන් - ජයන්ත විජේවික්‍රම, 2004, ඇස් ගොඩගේ)

## 38. පොල් ලද සැටි (ප්‍රබන්ධ රචනය)

**නිපුණතාව** : 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 12.2 නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- අත්දැකීම් ඇසුරෙන් ප්‍රබන්ධයක සැකිල්ලක් ගොඩ නගයි.
- උචිත චරිත තෝරා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- ප්‍රබන්ධකරණයේ දී භාෂාව නිර්මාණාත්මක ව භාවිත කරයි.
- ප්‍රබන්ධ නිර්මාණය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- පෙළපොතේ සඳහන් 'පොල් ලද සැටි' පාඩම කියවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් ප්‍රශ්න නගමින් එම ප්‍රබන්ධයේ නිර්මාණාත්මක ලෙස බස හසුරුවා ඇති ආකාරය ශිෂයයන් සමග සාකච්ඡා කරන්න.

  1. මානා නම් පුරුෂයාගේ සුවිශේෂ ලක්ෂණ මොනවා ද?
  2. නියං සමයේ ස්වරූපය ප්‍රකාශ කර ඇත්තේ කෙසේ ද?
  3. ඔවුන් දුටු ගසෙහි ලක්ෂණ මොනවා ද?

- ඇමුණම 1හි සඳහන් ව ඇති කතා සැකිල්ල සුදුසු ක්‍රමවේදයකින් ශිෂ්‍යයින්ට ඉදිරිපත් කරන්න. සැකිල්ලේ එකිනෙක අංක ප්‍රබන්ධයේ දී ගොඩනැගී ඇති අයුරු ගවේෂණයට අවස්ථාව ලබා දෙන්න. ප්‍රබන්ධයක සිද්ධි සවිස්තරාත්මක ව හා නිර්මාණාත්මක ව ගොඩනගන ආකාරය මේ ඇසුරින් පෙන්වා දෙන්න.
- පන්තිය කුඩා කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 2හි සඳහන් කතා වස්තු කිහිපයක සැකිලි කණ්ඩායම්වලට ලබා දෙන්න.
- තම කණ්ඩායමට ලැබෙන සැකිල්ල ඇසුරෙන් ප්‍රබන්ධයක් නිර්මාණය කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම්වල සාර්ථක ප්‍රබන්ධ බිත්ති පුවත්පතට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ප්‍රබන්ධෝපදේශය - කුමාරතුංග මුනිදාස
- ප්‍රබන්ධ සංග්‍රහය - කුමාරතුංග මුනිදාස

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ප්‍රබන්ධ රචනා කියවයි.
- සැකිල්ලක් ඇසුරින් ප්‍රබන්ධක් රචනා කරන ආකාරය සාකච්ඡා කරයි.
- ප්‍රබන්ධකරණයේ ශිල්පීය ප්‍රයෝග හඳුනා ගෙන භාවිත කරයි.
- සැකිල්ලක් ඇසුරින් ප්‍රබන්ධ රචනා කරයි.

ඇමුණුම 1

**පොල් ලද සැටි - කතා සැකිල්ල**

1. මානා නම් දඩ නායකයා - ඔහුගේ පිරිස - දෙ තිස් දෙනා - දින පතා දඩයම්.

2. නියං සමයේ දිනෙකැ මහ වනයේ දඩයම - මහ දාවල් පිපාසාව - දිය සෙවිල්ල.

3. වන මැදැ ගස - සිහින් දිග කඳ - පියා පත් වැනි කොළ - මහත් සැළි වැනි ගෙඩි.

4. ගසට ඇදීම - ගෙඩියෙකැ නටුව මහත් උත්සාහයෙන් කැපීම - ගෙඩිය මහ හඬින් බිම හීම.

5. එකකු ගෙඩියේ මුහුණ පොරොවෙකින් බොහෝ වේලා කපා සිදුරු කිරීම - උල්පත

6. තුන් තිස් දෙනාට මැ පැන් - ඉතිරි පැනින් එකකු නාවා පිරිසුදු කිරීම.

7. වැයක් දී ඔහු ගෙඩිය තුළට යැවීම - ඔහු මඳ සැසැ පිටපතට දීම - සියල්ලන්ගේ බඩ ගිනි නිවීම.

8. ඒ පිරිස පසු කාලයෙකැ දී ඒ ගසින් ගෙඩියක් ගෙනැ ගොස් ගමේ වැවීම - කැලැවේ දී එ තරම් ලොකු ගෙඩි ගමේ දී කුඩා වීම.

(ප්‍රබන්ධෝපදේශය, කුමාරතුංග මුනිදාස)

ඇමුණුම 2

## කතා සැකිලි

**1. වලස් කොළොං දබරය**

1. වලසෙක් නිදාගෙන සිටියි. කොළොං ගසකින් දිරාගිය අත්තක් කැඩී වලසා මත වැටේ. කොළොං ගස තමාට පහර දුන්නැයි කිපුණු වලසා ගසට වෛර බඳියි.

2. කරත්තයකට රෝදයක් සොයන කරත්තකරුවෙකු සුදුසු ගසක් සොයා ඇවිදියි. රෝදවලට සුදුසු ගසක් ලෙස කොළොං ගස පෙන්වයි.

3. කරත්තකරු ගස කපන්නට සැරසෙයි. ගසෙහි සිටි රුක් දෙවියෙක් කොළොං ලීය සවි වන්නට නම් වලස්සමක් බැන්ද යුතු බව කියයි.

4. කරත්තකරු නිශ්ශබ්ද ව ම ගස කපයි. කොළොං ගසින් පළිගත්තේ යැයි සතුටු වූ වලසා ළඟට වී බලා සිටි. කරත්කරු වලසාට ද පොරෝ පහරක් දෙයි.

5. කරත්තකරු ගස කපා වලස් සම කදේ බඳියි. එතැන් පටන් වලස්සු කොළොං ගසට වෛර බැන්දාලු.

**2. පුරුදු හණමිටිය**

1. පිට පළාතකට ගොස් එන යහළුවෝ දෙදෙනෙකි. ඔවුහු හණ මිටි දෙකක් කරගහ ගෙන එති.

2. අතර මග හණ නූල් නොමිලයේ දෙන තැනකි. දෙදෙනාගෙන් එක අයෙක් හණ මිටිය අතහැර හණ නූල් ගනියි. අනෙකා මා මෙතෙක් ගෙනා හණ මිටිය කෙසේ අතහරිම්දැයි කියා නොගෙන සිටියි.

3. නොමිලයේ හණ රෙදි දෙන තැනක් හමුවේ. හණ නූල් ගෙන ආ යහළුවා නූල් අතහැර රෙදි ගනියි. දෙවැන්නා හණ මිටියම රැගෙන යයි.

4. පටපිළි දෙන තැනක් හමුවේ. දෙදෙනා ම පෙර සේ ම කළහ. රන් රිදී මුතු මැණික් මග දී හමුවේ. දෙදෙනා ම පෙර සේ ම කරති.

5. පළමුවැන්නා අවසානයේ සතුටුට පත් වේ . දෙවැන්නා සුසුම් හෙළයි. සමහරු තම මතයෙහි ම එල්ලී සිටිති. නුවණැත්තෝ වඩා වටිනා දෙය දුටු විට ගනිති.

(ප්‍රබන්ධෝපදේශය, පිටුව, කුමාරතුංග මුනිදාස)